පූජ්‍ය මලලගම සුමනනන්ද අනුනායක
හිමිපාණන් විසින් විරචිත

# ''පාලිභාෂාවතරණායතූර''

නව සංස්කරණය
ශාස්ත්‍රවේදී පූජ්‍ය
**නින්දානේ වජිරඥාන හිමි**

# පාලිභාෂාවතරණායතූර

© නින්දානේ වජිරඥාන හිමි

ප්‍රථම මුද්‍රණය 1995

නව සංස්කරණය 2013

ISBN - 978-955-4756-00-7

ශාස්ත්‍රවේදී පූජ්‍ය

**නින්දානේ වජිරඥාන හිමි**

පරිගණක අක්ෂර සංයෝජනය

ජී. ඩබ්ලිව්. ලක්මිණි ද සිල්වා

මුද්‍රණය

**සිඟිති ප්‍රින්ටර්ස්**

ප්‍රකාශනය

**ශ්‍රී බුද්ධදත්ත පදනම,**

අග්ගාරාමය,

පොල්වත්ත,

අම්බලන්ගොඩ.

# හැඳින්වීම

මෙයට අවුරුදු 47 කට පමණ පෙර මුද්‍රණය කරන ලද 'පාලිභාෂාවතරණ' නමැති අගනා ග්‍රන්ථය පාලිභාෂාව හදාරණ නවකයන්ට මිණි පහනක් බඳුවිය. පාලිභාෂාවතරණය පොත් පෙලේ කතෘන්වහන්සේ වන අම්බලන්ගොඩ පොල්වත්තේ අග්ගාරාමාධිපතිව වැඩ විසූ අතිපූජ්‍ය අග්ග මහා පණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත මහානායක ස්වාමීන්වහන්සේගේම වචන වලින් කිවහොත් 'පාලි ඉගෙනීමට ආශා ඇතත් ගුරුවරුන් කරා පැමිණීමට අවකාශ නැතිව සිටින්නන් විසින් හෝ ගුරුවරුන් සොයා ගත නොහැකි භවතුන් විසින් මේ පොත් හා පාලිපාඨාවලි නම් පාඩම් පොතද පාලිභාෂාවතරණයතුර ද ගැනීමෙන් සෝත්සාහයෙන්ම පාලි ඉගෙනීමද කළ හැකි යනුයි.

දහම් පාසල් අද්ධ්‍යාපනයටත් පාලිභාෂාව ඇතුලත්කර තිබෙන මේ අවදියේ ළමයින් තුළ පාලි ඉගෙනීම ක්‍රමවත්ව පහසුවට හා ආශා උපදවන අන්දමට කිරීම සඳහා මෙම පොත ඉතා වැදගත් බව වැටහුණි. එහෙයින් සංශෝධනාත්මකව එය එළිදැක්වීමට උනන්දු වීමි.

මෙම සංශෝධිත සංස්කරණය සඳහා පරිගණක අක්ෂර සංයෝජනය කළ පී. ඩබ්ලිව්. ලක්මිණි ද සිල්වා මෙනෙවියට සහ පොත ශෝභන ලෙස මුද්‍රණය කළ අපිත් ප්‍රින්ටර්ස් ආයතනයටත් මගේ ස්තුතිය හිමි වෙයි.

පූජ්‍ය ශාස්ත්‍රවේදී නින්දානේ
වජිරඥාණ මහා ස්ථවිර

2013.02.20
අග්ගාරාමය, පොල්වත්ත,
අම්බලන්ගොඩ.

# පාලිභාෂාවතරණයතුර

## පළමුවෙනි පොත

### 1 වෙනි අභ්‍යාසය

#### සිංහලට නැඟියයුතු කොටස

1. මිනිසුන්ගේ. 2. දෙවියන්. 3. අත. 4. පාදයෙහි 5. කය කරණකොට 6. බුදුවරුන් කෙරෙහි 7. ධර්මතෙම 8. සංඝයා කෙරෙන් 9. කුමාරයාගේ හෝ කුමාරයාට 10. රජුන් විසින් 11. වෙළෙන්දට 12. මිත්‍රයා කෙරෙහි 13. ලියන්නන්ට හෝ ලියන්නන්ගේ 14. දාසයා කෙරෙහි 15. ගොපල්ලා විසින් හෝ කරණකොට 16. පුත්‍රයන් විසින් හෝ කෙරෙන් හෝ කරණකොට 17. පය 18. දාසයන් හෝ දාසයා කෙරෙහි 19. ගොවියෝ 20. රෙදි සෝදන්නන් කෙරෙහි.

#### පාලියට නැඟිය යුතු කොටස

1. දේවස්ස 2. මනුසෙසසු 3. හත්‍ථෙසු 4. පාදෙහි 5. භූපාලානං 6. කුමාරස්ස 7. බුඬා 8. ධමෙම 9. සංඝසස 10. පුත්තමහා 11. දාසානං 12. චොරෙන 13. මිතතානං 14. පාදමහි 15. ලේඛකෙහි 16. කස්සකමහි 17. ගොපාලෙ 18. වාණිජෝ 19. කම්මකාරමහා 20. මනුසෙසන

## 2 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1.පුරුෂයාගේ ගොන්නු 2. මිනිසුන්ගේ අත් 3. බුදුන්ගේ ධර්මය 4. අහසෙහි පක්ෂීහු 5. ගමේ මිනිස්සු 6. අශ්වයන්ගේ කකුල් 7. ලෝකයෙහි ගස් 8. රජුන්ගේ ද්වීපයෝ 9. ගලඋඩ සිංහයා. 10. ඇඳෙහි ළමයා 11. අහසෙහි සූර්‍යයා 12. පහනේ එළිය 13. ගස්වල වඳුරෝ 14. රජුගේ අශ්වයා

### පාලියට නැඟිය යුතු කොටස

1. අජස්ස පාදං 2. වානරස්ස හත්ථෙහි 3. සීහස්ස කායො 4. ගාමෙ කුමාරා 5. ආකාසෙ චන්දෙ 6. පාසාණෙ සුනඛසස 7. මඤ්ඤවමහි මනුසෙසා 8. සුරියස්ස ආලොකෙන 9. ගොණස්ස පාදෙහි 10. මනුස්සසස ගාමොා 11. ලොකස්ස දීපා 12. ගොණස්ස පාදෙහි 13. බුඬසස ධමෙම 14. භූපාලස්ස ගාමෙසු 15. මගෙග අස්සා

## 3 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. බුදුවරයා සිටියි 2. මුවෝ දුවත් 3. සිංහයෝ නිදත් 4. මිනිහා යයි 5. රෙදි සෝදන්නෝ සෝදත් 6. ගොවියෝ සීසාත් 7. ලියන්නා ලියයි 8. දාසයා හැසිරේ 9. ඇඳන්වල නිදත් 10. පහන් දල්වත් 11. ගස්වලට නගිත් 12. ඌරා හාරයි 13. බල්ලෝ අනුභවකරත් 14. අශ්වයා දුවයි 15. එළුවෝ නිදත් 16. කම්කරුවෝ ගෙනඑත් 17. වෙළෙන්දෝ හිඳිත් 18. ගොපල්ලා අනුභව කරයි 19. ගොන්නු කති 20. වඳුරා ගසට නගී.

### පාලියට නැඟියයුතු කොටස

1. සුනඛො භුඤ්ජති 2. වානරා ආරුහනති 3. වරාහා ධාවනති 4. දාසො හරති 5. කම්මකාරා පචනති 6. අජා තිඨනති 7. වාණිජො වරති 8. රජකො ධොවති 9. මිගො තිඨති 10. ගොණා කසනති 11. කස්සකො බණති 12. මනුස්සත්ත අසෙස 13. කම්මකාරස්ස ගාමො 14. ගොපාලානං ගොණා 15. ලෙඛකො දීපං හරති 16. මනුස්සා

මක්‍ඥවපු සයන්ති 17. සීහා මිගෙ ඛාදනති 18. දාසා රුකඛං ආරුහන්ති 19. චොරා ගාමෙ ආහිණ්ඩනති 20. ගොපාලො ගොණං ආහරති

## 4 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. මිනිස්සු සූයය්‍ාා බලත් 2. ගොන්නු ගලඋඩ සිටිත් 3. වෙළෙන්දා ගමෙහි හැසිරේ. 4. පක්ෂියා ගසේ ඉඳියි 5. බුදු රද ධර්‍මය කියයි 6. මම පහනක් ගෙනෙමි 7. අපි ගොනුන් ගෙනයමු 8. සංඝතෙමේ ගමට යයි 9. තෝ සිංහයා දක්නෙහි(හෝ බලන්නෙහි) 10. රජවරු අසුන් පිට නගිත් 11. දෙව්වරු අහසින් යත් 12. අශ්වයෝ දිවයින්වල දුවත් 13. තෝ පාවලින් හැසිරෙහි 14. තෙපි අත්වලින් ගෙන යව් 15. අපි ලෝකයෙහි වසමු

### පාලියට නැඟිය යුතු කොටස

1. අසෙසා පාසාණෙ තිඨති 2. අජා ගාමෙ චරන්ති 3. තුමෙහ සුරියං පසසථ 4. චනෙදූ ආකාසෙ ආරුහති 5. මනුස්සා මක්‍ඥෙචසු සයන්ති 6. ගොණා සීහමහා ධාවනති 7. අහං ලොකෙ වසාමි 8. ත්‍වං දීපං ආහරසි 9. මයං දීපෙ වසාම 10. භූපාලො සිහං පස්සති 11. දෙවො ආකාසෙ ගචඡති 12. වානරො වරාහෙන කිළති 13. මයං මනුස්සානං කායෙ පසසාම 14. ත්‍වං රුකෙඛ සකුණං පසසයි.

## 5 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. පුතා ධර්‍මය ඉගෙනගනී 2. මිත්‍රයෝ සිංහයන් බලත් 3. සොරු අශ්වයන් ගනිත් 4. මිනිස්සු පක්ෂීන් මිලට ගනිත් 5. ගොපල්ලා ගොනුන් විකුණයි 6. බුදුරජ ධර්‍මය දෙසයි 7. සිංහයා මුවන් මරයි 8. වෙළෙන්දාගේ පුත්තු එළුවන් විකුණත් 9. අපි වෙළෙන්දාගෙන් ඇඳන් මිළට ගනිමු 10. ත්‍රියන්නා මිත්‍රයා සමග පාරේ යයි 11. දාසයෝ මිත්‍රයන්ගේ බල්ලන් ගෙනයත් 12. කාක්කෝ අහසෙහි

පියාඹත් 13. මම බුදුන් පුදමි 14. තෝ පහනක් දල්වව 15. අපි ධර්මය දනිමු 16. දාසයා මගදී ගොවියා(දෙස) බලයි 17. තෙපි බුදුන් ධර්මය අසව් 18. සොරු මිනිසුන්ගේ අශ්වයන් සොරකම් කරත් 19. මිනිහා අතින් පහනක් ගනී 20. චන්ද්‍රයා පර්වතයෙන් උදාවේ.

### පාලියට නැගියයුතු කොටස

1. චොරෝ ගොණං චොරෙති 2. ලෙඛකස්ස පුතෙතා අස්සං කිණාති 3. කස්සකස්ස පුතතා ධම්මං උගගණහනති 4. වාණිජං දීපෙ චිකකිණත්ති 5. කස්සකො ගොණෙ කිණාති 6. මිතතසස පුතෙතා ගාමෙ උගගණහාති 7. භූපාලො දීපං පාලෙති 8. මයා වාණිජසස පුත්තං පස්සාම 9. වානරා සකුණෙ පීළෙන්ති 10. මනුස්සස්ස හත්ථෙ ඔලොකෙථ 11. චොරා ලොහෙන අජෙ චොරෙන්ති 12. දාසා කුමාරානං ආහාරං ආහරන්ති 13. මයං බුඬසස ධම්මං සුණාම 14. තුමෙහ සංඝං පූජෙථ 15. කුමාරෝ මිතතසස සුනඛං ආහරති 16. චොරා මගගමහි මනුසෙස මාරෙන්ති 17. කුමාර ගාමෙ කිළනති 18. කමමකාරා දීපෙ ජාලෙනති 19. අස්සා ගාම මහා ධාවන්ති 20. සීහා මිගෙ මාරෙනති

**6 වෙනි අභ්‍යාසයෙහි විවරණ කළයුත්තක් නැත**

## 7 වෙනි අභ්‍යාසය

### සිංහලට නැගිය යුතු කොටස

1. භික්ෂුතෙම ධර්මය කීයේය 2. ගෘහපතිහු වී මැන්නාහ 3. සර්පයා අධිපතියාගේ අත දෂ්ට කෙළේය 4. පණ්ඩිතයා අතින් මැණික ගත්තේය 5. දිවියෝ පර්වතයෙහි ඇවිද්දාහ 6. සතුරා කඩුවෙන් ගොනාට ගැසී 7. පණ්ඩිතයෝ දිවයිනෙහි නිධානයක් හෑරූහ 8. තෙපි ආගන්තුකයන්ට වඳුරන් දුන්නෙව් 9. මුනීහු අධිපතින්ගේ ගමට ගියහ 10. වඳුරා සර්පයාගේ බඩට ගැසුවේය 11. ගෘහපතියාගේ ළමයා මූදට ගියේය 12. අධිපතිතෙමේ පණ්ඩිතයන්ට මැණික්

දුන්නේය. 13. වඳුරෝ අත්වලින් ගස්වලට නැංගාහුය 14. රජුගේ අශ්වයා ගමට දිව්වේය 15. සොරු අධිපතියාගේ නිධානය ගෙන ගියහ.

## පාලියට නැඟියයුතු කොටස

1. දීපයො මිගෙ ඛාදිංසු 2. මුනයො ගිරිමහා ගාමං ආගචඡිංසු 3. අහයො මනුසෙස ඩසිංසු 4. ගහපතිනො වීහිං චොරා හරිංසු 5. වාණිජා කවීනං මණයො ගණ්හිංසු 6. මිතෙතා අතිථීනං අසසං අදාසිං 7. ඉසයො අධිපතිනං ගාමෙසු චරිංසු 8. මුනයො ගාමෙසු මනුස්සානං ධමමං භාසිංසු 9. ගහපති අරිනො පාණිං ඡින්දි 10. පති අතිථිනං වීහී අදාසි 11. භූපති චොරානං අසයො ගණ්හි 12. කාකො රුක්ඛම්හා ආකාසං උඩෙඩසි 13. රුකෙඛ කපයො දීපිං පහරිංසු 14. කස්සකස්ස පුතෙතා වීහිනං රාසි මිණි 15. භූපතිනො හත්ථෙ අසි අත්ථි.

## 8 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. මුනීහු ඇඳන්වල හුන්හ 2. මම දිවයිනෙහි හැසුරුනෙමි 3. සොරු ගෘහපතියාගේ නිධානය සොරකම් කළහ 4. අපි රජුගේ කඩුව බැලුවෙමු 5. තෝ ආගන්තුකයාට ආහාර දුන්නෙහි 6. අධිපතියා වෙළෙන්දාගෙන් මැණික් මිලට ගත්තේය 7. ස්වාමියා ගොවියා අතින් වී ඉල්ලුවේය 8. සෘෂිහු පණ්ඩිතයන්ට ධර්මය දෙසූහ 9. වඳුරෝ පර්වතයෙන් ගසට දිවූහ 10. වෙළෙන්දෝ මූදෙහි ගියහ 11. අපි මාර්ගයෙන් ගියෙමු 12. දිවියා වඳුරකු මැරී 13. තෙපි ස්වමියාගේ පහන් ගත්තහු 14. මම බුදුන්ගේ පාදයන් පිදුවෙමි 15. පණ්ඩිතයෝ වඳුරන්ට ආහාර දුන්හ 16. සතුරෝ කඩු ගෙන ආහ 17. සර්පයා වඳුරාගේ අත දෂ්ඨ කෙළේය 18. අපි පර්වතයෙන් හඳ දකිමු 19. තෙපි භික්ෂූන්ට ආහාර දුන්නහු 20. රජ නිධානයන් රැක්කේය

---

* "මිගානං සන්තිකං" කියාත් යෙදිය හැක.

## පාලියට නැගියයුතු කොටස

1. දාසෝ අසීනා අරිං පහරි 2. මයං ගහපතිනෝ ආහාරං දදිම්හ 3. සෝ ගිරිම්හා වානරං ආහරි 4. වාණිජා මගෙගන ගාමං ගචඡිංසු 5. සකුණා රුක්ඛම්හා ආකාසං උඩ්ඩියිංසු 6. චොරා භූපතිනෝ මණයෝ චොරෙසුං 7. අහං ඉසීනං ආහරං අදදිං 8. කවිනෝ පුත්තා මුනිම්හා ධම්මං සුණිංසු 9. අහං මගෙග දීපිං පස්සිං 10. සීහෝ පාසාණෙ මිගං මාරෙසි 11. තෙ දීපෙ ගිරිං පස්සිංසු 12. කුමාරෝ ජලනිධිං ගච්ඡි 13. සුනඛා ගාමං ධාවිංසු 14. වාණිජෝ අධිපතිම්හා අස්සං කිණි 15. අතිථී මුධීනා මණිං ආහරි 16. කපි අහිං කුචඡිනා ගණ්හි 17. ගහපති සඤ්ඤෙච සයි 18. කුමාරෝ හත්ථෙහි කපිං පහරී 19. අහං භූපතිනෝ අසිං පස්සිං 20. කවයෝ ආහරං භුඤ්ජිංසු

## 9 වෙනි අභ්‍යාසය

### සිංහලට නැගිය යුතු කොටස

1. මම මාගේ පුත්‍රයාට අශ්වයකු දුන්නෙමි 2. තෝ අපේ ගමට යෙහි 3. අපි තාගේ අත් දකිමු 4. මාගේ පුත්‍රයෝ පර්වතයට නැංගාහ 5. තොපගේ බල්ලෝ මාගීයෙහි නිදාගත්හ 6. අපේ මිත්‍රයෝ සොරාට කඩුවකින් ගැසූහ 7. තොපගේ දාසයෝ සතුරන්ගේ අශ්වයන් ගෙන ගියහ 8. සොරා මාගේ පුත්‍රයාගේ මැණික් සොරකම් කෙළේය 9. සෘෂීහු මාගේ ගෙයි නොවිසූහ 10. පණ්ඩිතයා ඔබගේ පුත්‍රයන්ට දහම් දෙසී 11. අප වෙත ක්‍රෝධය නැත 12. තෙපි වෙළෙන්දාට එළුවන් වික්කහු 13. අපි රජුට මුවන් වික්කෙමු 14. ගෘහපතියාගේ පුත්‍රයා මට ගැසුවේය 15. අධිපතියාගේ දාසයෝ මාගේ ගොනුන්ට ගැසූහ 16. මම තොපගේ වී නොගත්තෙමි 17. දිවියා මුවා වෙතින් නොදිව්වේය 18. තෙපි සර්පයන් නොමරව් 19. අපි ආගන්තුකයන් සඳහා ආහාර පිසමු 20. වඳුරෝ මාගෙන් කෑම ඉල්ලූහ

### පාලියට නැගිය යුතු කොටස

1. අහං මය්හං මණයෝ වාණිජස්ස වික්කිණිං 2. මයං අම්හං ගොණෙදාසානං දදිම්හ 3. තුම්හෙ මයා අසිංකිණි ත්ථ 4. ත්ථං

හත්ථෙහි කපයො මා පහරො 5. අධිපති ගිරිම්හා සිහං ආහරි 6. මුනි තුම්හා කං ධම්මං දෙසෙසි 7. මයං අහීනං ආහාරං දදිම්හ 8. ගහපතිනො දාසා අම්හං වීහිං හරිංසු 9. තුම්හෙ උදධිං න ගච්ඡිත්‍ථ 10. මය්හං මුධීම්හි මණයො නසන්ති 11. කවිනො පුත්තො සුනඛං යඨිනා පහරි 12. අම්හාකං පුත්තා ඉසිම්හා උග්ගණ්හන්ති 13. තව කපි රුක්ඛාම්හා පති 14. මම සුනඛො මයා ගෙහං ගච්ඡි 15. අහි මම පුත්තස්ස පාදං ඩසිං 16. දීපි මග්ගෙ ගොණං මාරෙසි 17. මයං භූපතිනො අසිං න ඔලොකයිම්හ 18. අහං මිගෙ*න ගච්ඡිං 19. අම්හාකං මිත්තා සීහෙ පස්සිංසු 20. ත්‍ථං කවිම්හා සකුණං කිණො

## 10 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. මන්ත්‍රීතෙම ඇතා පිට නගින්නේය 2. අපි සිටාණන්ගේ ගෙට යන්නෙමු 3. තෝ ස්වාමියාගේ පුත්‍රයාට වඳුරෙකු දෙන්නෙහි 4. සමූහඇත්තෝ සුවපත්වන්නාහ 5. අපගේ ස්වාමීහු දීඝීකාලයක් ජීවත්වන්නෝ නොවෙත් 6. පව් කරන්නා සැරයටියෙන් සජීයා මරන්නේය 7. මාගේ පුත්‍රයෝ සිටුහුගේ ගමෙහි වසන්නාහ 8. මොනරා කුඩ ඇත්තා කෙරෙන් භයවන්නේය 9. රථාචාය්‍යීයා අශ්වයන් ගමින් ගෙන යන්නේය 10. තෙපි මාලාඇත්තන් හා චන්ද්‍රයා බලන්නහු 11. බලවතා සජීයාගේ ශරීරය කපන්නේය 12. අපගේ මන්ත්‍රීවරයෝ බල ඇත්තෝ වූහ 13. කුෂ්ටඇත්තා රථාචාය්‍යීයාගේ පාදයට සැරයටියෙන් ගසන්නේය 14. සිටුවරයෝ මාලා ඇති පුරුෂයන් බලන්නාහුය 15. අපි ගෙයි බත් අනුභව කරන්නෙමු.

### පාලියට නැඟිය යුතු කොටස

1. අම්හාකං සාමී මන්තීනං සන්තීකං ගච්ඡිස්සති 2. සෙට්ඨී දීඝජීවී භවිස්සති 3. පාපකාරිනො සුඛිනො න භවිස්සන්ති 4. දාඨී කුඨීනං පහරිස්සති 5. මන්තී සාමිම්හා සිඛිං ලභිස්ස්සති 6. සාරථී මන්තීහි අස්සෙ කිණිස්සති 7. මය්හං සිඛිනො පබ්බතෙ ජීවිස්ස්යන්ති 8. භොගිනො බලිනො ඩසිස්සන්ති 9. සාමිනො පුත්තා සෙඨිනො

සීහෙ ඔලොකෙස්සන්ති 10. මයං අතිථීම්හා මිගං කිණිස්සාම 11. කරි පාදෙන පුරිසං මාරෙසි 12. නත්වං සෙඨී භවිස්සසි 13. රඤ්ඤො පුත්තා මන්තීහි භඤ්ඳිස්සන්ති 14. කපි රුක්ඛම්හා න පතිස්සති 15. මයං කරිං සාරථීනො සමීපං හරිස්සාම

## 11 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. නෑයෝ බාලයන් සමග අපගේ ගෙට එන්නාහු 2. සතුරා පොරවෙන් තාගේ ගස් කපන්නේය 3. ගුරුවරයා මගේ බාලයන්ට උක්ගස් දුන්නේය 4. භික්ෂූහු මුණුබුරන්ට ධර්ම්ය දේශනා කරන්නාහුය 5. තෝ නෑයා සමග මුහුදට යන්නෙහි 6. අශ්වයෝද ගොන්නුද ගමෙහි හැසිරෙන්නාහ 7. තෙපි තිරිසනුන් හෝ පක්ෂීන් හෝ නොමරව් 8. අපි නායකයන් සමගම බුදුරදුන් පුදන්නෙමු 9. සහෝදරයා උණ ගසෙන් පක්ෂියෙකු මරන්නේය 10. අපගේ පියවරු සතුරන්ගේ කොඩි ගෙනාවාහුය 11. දිනූ තැනැත්තා දෙන තැනැත්තාට බාහුවෙන් ගැසුවේය 12. බුදුරද අපේ නායකයා වූයේය 13. අපි පියා සමග උණගස් ගෙන එන්නෙමු 14. සර්පයෝ මීයන් කත් 15. මාගේ සතුරෝ ඒදණ්ඩෙහි හුන්නාහුය 16. අපගේ සහෝදරයෝද, පියවරුද මුහුදට ගියාහුය 17. මම මාගේ සහෝදරයා සමග මොනරුන් විකුණන්නෙමි 18. බාලයෝ හැන්දෙන් බත් ගෙනාවාහුය 19. ගමට යන්නා ගස්වල කොඩි බලන්නේය 20. පාලම සාදන්නා ගමින් උණ ගස් ගෙනාවේය

### පාලියට නැඟිය යුතු කොටස

1. අහං මම එරසුනා වෙළවො ඡින්දිස්සාමි 2. ගරවො ජෙතාරං පස්සිස්සන්ති 3. තෙ කරිනො උච්ඡවො හරිංසු 4. ධම්මං සොතාරො භික්ඛූනං සමීපං ගච්ඡිස්සන්ති 5. දීපයොච සීහා ච ගාමෙසු නවසන්ති 6. අහං මය්හං භාතරා සඬිං සප්පාරං ගච්ඡි 7. අම්හාකං පිතරො ච භාතරො ච වාණිජා අහචිංසු 8. අම්හාකං බන්ධවො සිඛිනො ච පක්ඛිනො ච කිණිස්සන්ති 9. වානරො ච මිගො ච පබ්බතෙ වසන්ති 10. සො මම නත්තුනො බාහුං පහරි 11. සන්තු නො අම්හාකං නෙතු කෙතුං හරිස්සන්ති 12. සෙතුං

කත්තාරො ගාමා වෙළවො ආහරිංසු 13. ආඛවො දාඨිහි හායිස්සන්ති 14. අහං මම බන්ධූනං ඔදනං දස්සාමි 15. ආහාරං දාත කටච්ඡුනා ඔදනං ආහරි 16. මය්හං පිතු පසවො පබ්බතෙ අඨංසු 17. අම්හාකං නත්ත ච භාතරො ච හත්ථීනො න කිණිස්සන්ති 18. ගරුනො පුත්තො අස්සං වා ගොණං වා කිණි 19. මය්හං පුත්තො වා භාතා වා බාලානං කපිං ආහරිස්සති

## 12 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. භාගාවතුන්වහන්සේ අද අසන්නන්ට ධර්ම දේශනාකරන්නේය 2. භික්ෂූහු එදා භාග්‍යවතුන්වහන්සේගේ පා වැන්දාහුය 3. ඇස් ඇත්තෝ හැමකල්හි සූර්‍යයා බලත් 4. එකල්හි බලවත්හු සතුරන්ට උණගස්වලින් ගැසූහ 5. තෙපි කවදා ධනවතා බලවී ද 6. අපි හෙට සිල්වත් භික්ෂුව වඳින්නෙමු 7. භාග්‍යවතුන්වහන්සේලා සියල්ල දන්නෝ වෙත් 8. පණ්ඩිතයෝ දැන් කුලවතාගේ ගෙට ගියාහුය 9. හිමාලය පර්වතයෙහි සිංහයෝ ද තාපසයෝ ද හැමකල්හිම වසත් 10. පින්වතාගේ මුනුබුරා නෑයන් ඇත්තෙක් විය 11. කුලවතුන්ගේ සහෝදරයෝ ධනවත්හු නොවූහ 12. මම හිමාලයෙහි ගෙඩි ඇති ගස් දුටුවෙමි 13. පෙර අපි නෑයන් සමග හිමාලය පර්වතයට ගියෙමු 14. ඊයේ හවස නුවණැත්තෝ පිරිස් ඇත්තන්ගේ ගමට ගියාහුය 15. පණ්ඩිතයෝ පසුව අධිපතියාගේ ගෙයි වාසය කරන්නාහුය 16. කීර්ති ඇත්තන්ගේ සහෝදරයෝ බලවත්හු වෙති 17. අපගේ පියවරු සිහි ඇත්තෝ වූහ 18. පින්වත්හු එක් කලක මැණික් ලබත් 19. නුවණැත්තෝ අපගේ සර්ෂයන්වහන්සේට වඳිත් 20. බලවතාගේ මුනුබුරා උදෑසන මගේ ගොනා ගත්තේය

### පාලියට නැඟිය යුතු කොටස

1. චක්ඛුමා පාතො සීලවන්තෙ පස්සති 2. ධනවන්තානං පුත්තා සදා පඤ්ඤවන්තො න භවන්ති 3. බන්ධුමා අරයො න

භායති 4. ගුණවතං භාතරො තදා සත්ථු පාදෙ වන්දිංසු 5. තුම්හාකං නත්තාරො ඉදානි බුඩිමන්තො න භවන්ති 6. බුඩිමා සුවේ කුලවතං ධම්මං (දෙසෙස්සති) භාසිස්සති 7. ධනවන්තෙ පුත්තෙහි සඬිං හිමවන්තං ගමිස්සන්ති 8. භගවා සීලවන්තානං ච පඤ්ඤවන්තානං ච ගරු භවි 9. යසවන්තො කදා අම්හාකං ගාමං ආගමිස්සන්ති? 10. බලවතං පුත්තා පච්ඡා ගුණවන්තො භවිස්සන්ති 11. එකදා විඤ්ඤුනො භාතා ගුණවන්තං පහරි 12. පුරෙ අහං පභුනො ගෙහෙ වසිං 13. හීයෝ මග්ගෙ හත්ථී ච අස්සා ච අථංසු 14. කුලවා ඉදානි සීහං ච මිගං ච කිණි 15. බලවා හිමවන්තම්හා කරිං සිහං ච ආහරි 16. අජ්ජ පාතො ධනවතො පුත්තා හිමවන්තං අගමංසු 17. අම්හං නත්තාරො සීලවන්තෙ පිතරෙ වන්දන්ති 18. පුඤ්ඤවන්තානං පුත්තා බන්ධුමන්තො භවන්ති 19. සත්ථුනො ධම්මං සොතාරො සදා සුඛිනො භවිස්සන්ති 20. බලවතං දාසා හීයො සායං මම අස්සෙ හරිංසු

## 13 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. ස්ත්‍රීහු නැව්වලින් ගංගාවල යෙත්වා 2. තෝ සාලාවෙහි කන්‍යාවන්ට බත් පිසව 3. ඉදින් නුඹලා නාන්නහු නම් මමද නාන්නෙමි 4. යම්තාක් නුඹගේ කන්‍යාව එන්නේද ඒ තාක් මෙහි සිටුව 5. ලක්දිව රජුගේ සේනාවෝ එහිදී ජයගනිත්වා 6. දේවතාවෝ පොළොවෙහි මිනිසුන් රකිත්වා 7. තෙපි කන්‍යාවගේ අතෙහි මල්දමක් තබව් 8. සාලාවගේ ඡායාව පොළොවෙහි ඇත 9. සොරු පෙට්ටි මෙතැනින් ගුහාවට ගෙන ගියාහ 10. ඉක්බිති කන්‍යාවෝ ගොයාට ගල් කැට වලින් ගැසූහ 11. තෝ එතැනින් කොහි යන්නෙහිද? 12. යම් තැනක නුවණැත්තෝ වාසය කරත්ද මම එහි යන්නෙමි 13. ඇතා ගමින් පිටත ගසක අතු කැඩුවෙය 14. ඉදින් තෙපි එකල්හි පිරිසට කථා කරන්නහු නම් මමද කථා

කරන්නෙමි 15. ස්ත්‍රීන්ගේ මැණික් පෙට්ටිය ඇතුළේ තබව් 16. අපි ගම භාත්පස ගුහාවන්හි වසමු 17. අපේ අම්මා හෙට දෝලාවෙන් ගමට යන්නේය 18. තෙපි පිරිස සමග මගේ කථාව අසව් 19. යම්සේ මගේ භාර්යාව කියන්නීද එසේ මම කියන්නෙමි 20. තරුණිය කන්‍යාවගේ නහයෙහි ගල් කැටයක් දැමී.

### පාලියට නැඟිය යුතු කොටස

1. චොරෝ මඤ්ඤූසං ගුහා හරි 2. තුමාහාකං මාතරෙහි(සඬිං) සුවෙ ගාමං ගච්ඡථ 3. වනිතාය භාතා හීයෝ නාවාය අගමි 4. සදා මම පූජායෝ විඤ්ඤූානං භවන්තු 5. තුම්හෙ අජ්ජ කඤ්ඤූාය හත්‍ථෙ මාලං ඨපෙථ 6. යථා තුම්හාකං පිතා කථෙසි, තථා කරොථ 7. යදා පරිසා ගමිස්සති තදා අහම්පි ගමිස්සාමි 8. සචෙ සාමිනෝ භරියා සහායං කථෙස්සති, මයං තං සුණිස්සාම 9. වනිතා මඤ්ඤූසාය තුලං ආනෙත්වා තහිං සක්ඛරා ඛිපි 10. දරිකාය මඤ්ඤූසාසු මණයෝ සන්ති 11. කඤ්ඤූයෝ පාතෝ විථියා වාලිකං ආහරිංසු 12. රඤ්ඤෙ හත්‍ථී ගාමස්ස අන්තෝ රුක්ඛානං සාඛායෝ පිනිදිංසු 13. ලංකායං සිලා ච සක්ඛාරා ච පබ්බතා ච සන්ති 14. අථ රාජා පරිසාය සද්ධිං ගංගායං නාවාය අගමාසි 15. ලතාය ඡායා වසුධාය අත්‍ථී 16. දෙවතා අම්හාකං පුත්තෙ ච නන්තාරෙ ච රක්ඛන්තු 17. මය්හං සෙනා ගාමම්හා බහි ජයතු 18. මයං අම්හාකං පිව්හාහි වාචා භාසිස්සාම 19. අහං සහායං දරිකාය කථං සුණිං 20. මය්හං මාතා අඬා අජ්ජ සායං ආගම්ස්සති.

## 14 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. බැමිණි කුමරිය සමග උදෑසන ගඟෙහි නා ගෙට ගියාය 2. ස්ත්‍රීහු බත් පිස අනුභව කොට කිකිළියන්ට ද දුන්නාහුය 3. හෙට රාජදේවියගේ කුමරියෝ යෙහෙළියන් සමග වැවට ගොස් නාන්නාහුය 4. රැජිනිය පිරිස සමග දිවයිනෙන් නික්මී නැවෙන් යන්නේය 5. වැඳිරිය ස්ත්‍රීන් දැක ගසට නැඟී හුණි 6. තරුණිහු

අත්වලින් ගස්වල අතු ගෙන කැඩුවාහුය 7. නුඹලා නැවත වැව තරණයකොට වනයට ඇතුල්වව් 8. දිවියෝ කැලෑවල සිට මුවදෙනුන් මරා කත් 9. තරුණියන්ගේ පියවරු සවස්කාලයෙහි වනයෙන් අවුත් අනුභවකොට නිදන්නාහුය 10. ඇතින්නී පොකුණට බැස නා කෙසෙල් ගස් කන්නේය 11. සිංහ දෙන එළුවා මරා පැටවුන්ට දුන්නේය 12. මාගේ නැන්දා පුත්‍රයාට බෙරයක් ගෙනෙන්නේය 13. කිරිල්ලියෝ පොළොවෙහි හැසිර පැටවුන්ට කෑම සොයත් 14. කවුඩු දෙන්නු ගසේ අතු වල හිඳ වී කෑවාහුය 15. දෙන්නු බිම නිදා හිඳ ගමෙහි හැසිර වනයට ගියාහුය

## පාලියට නැඟිය යුතු කොටස

1. සීහි භීයෝ මිගිං මාරෙත්වා ඛාදි 2. බ්‍රාහ්මණි නදිං තරීත්වා අටවියා කින්නරිං ආනෙසි 3. අථ තරුණියා භාතා ගඬගායං නහාත්වා ගෙහං ගනත්වා භුඤ්ජි 4. වානරි රුක්ඛං ආරුහිත්වා හත්ථස්ස අඬගුලිහි සාඛං ගණ්හි 5. තරුණියෝ වාපිං ගනත්වා නහාත්වා කීළිත්වා ඛිප්පං ගාමං ආගමිංසු 6. තුම්හෙ දෙණිහි නදිං තරිත්වා ගාමෙහි කුක් කුටියෝ ආතෙථ 7. තරුණි පිතුනෝ ඔදනං පචිත්වා සඛීහි සද්ධිං තත්‍ථ වාපිං අගමාසි 8. අම්හාකං භාතරෝ අජ්ජ පාතෝ අටවිං ගන්ත්වා මිගිං මාරෙසුං 9. මයං වාපියං නහාත්වා ගාමං ගනත්වා පවිත්වා භුඤ්ජිත්වා සයිස්සාම 10. මම භගිනියෝ තතෝ දොණිං ආරුහිත්වා නදියං අගමංසු 11. කුමාරියෝ ඛිප්පං මාලං ආනෙත්වා දෙවියා ගීවාය ඨපෙසුං 12. සෙඨිනෝ ධෙනුයෝ ච ගොණා ච සායං අටවියා නික්ඛ මම් වාපියං(පානීයං) පීත්වා ගාමං පවිසිංසු 13. දෙවි පරිසාය සද්ධිං රඤ්ඤෝ පොක්ඛරණිං ගනත්වා නහායි 14. ඉත්ථියා භගිනි දුන්දුභිං කිණිත්වා සඛියා අදාසි 15. සීහා හත්ථී ච හත්ථිනියෝ ච මාරෙත්වා ඛාදිත්වා අටවිසු වසන්ති

# 15 වෙනි අභ්‍යාසය

## සිංහලට නැඟිය යුතු කොටස

1. දාසියගේ මව දෙන රූණෙන් බැඳ මෙහි ගෙනාවේය 2. මගේ නැන්දා උදෑසන කැඳ පිස දූවරුන්ට දෙන්නේය 3. ඇතින්නියෝ වනයන්හි හැසිර එහි වළ්වල වැටුණාහ 4. ධනවත් ස්ත්‍රියගේ නැන්දම්මා අද මෙහි අවුත් භික්ෂූන් වඳින්නේය 5. රූපිනියගේ දූවරු ඊයේ විහාරයට ගොස් බුදුන් මල්දම්වලින් පිදුවාහුය 6. කන්‍යාවන්ගේ පියවරු හැමකල්හි දූවරුන්ගේ අභිවෘඩිය කැමතිවෙත් 7. නුඹ කොතැනින් දෙනුන් මිළදී ගන්නෙහි ද? 8. කොතැනදී නුඹගේ සහෝදරියෝ නාලා පිස අනුභව කළාහු ද? 9. කුමාරයෝ ගඟට ද වැවට ද අතරේ ක්‍රීඩාකළාහුය 10. ස්ත්‍රියගේ දූවරු ගෙය ඇතුළේ ඇඳන්වල නිදත් 11. දූවගේ කෙණ්ඩයෙහි දදයක් තිබේ 12. තරුණිය මල්දම් ගෙන සවස නැන්දාගේ ගෙට යන්නේය 13. අපගේ මව්වරුන්ගේ දෙන්නු හැමතැන්හි හැසිර රාත්‍රියෙහි එන්නාහුය 14. ධනවත් ස්ත්‍රියගේ මුනුබුරෝ මාඝයෙහි සරසට දූව වනයට ඇතුළ් වූහ 15. හෙනය ගස උඩ වැටී අතු කඩා ගස මැරුවේය

## පාලියට නැඟිය යුතු කොටස

1. කඤ්ඤය මාතා යුවතිං මාලං අදාසි 2. ඉත්ථී පාතො රජ්ජුහි ධෙනුයො බන්ධිත්වා අටවිං හරි 3. තරුණියා භාතා දිපම්හි සබ්බත්ථ චරිත්වා ආගන්ත්වා ආහාරං භුඤ්ජි 4. කත්ථ තව මාතුයා භගිනීව සති? 5. මය්හං භගිනියා ධීතරො ගංගායං නහාත්වා වාපිං අගමිංසු 6. තෙකදා දෙණියා ආගමිස්සන්ති? 7. දෙවියා මාතුලානි හීයො ඉධ ආගන්ත්වා ඛදලියො ඔලොකෙසි 8. ධනවතියා ධීතරො වාපියං නහාත්වා ගාමේ තිරියං ගච්ඡිංසු 9. අම්හං සස්සු යාගුං පවිත්වා සබ්බේහි සද්ධිං පිවති 10. සස්සුයා ධෙනුයො පබ්බතස්ස ච නදියා ච අන්තරෙ චරිංසු 11. තුම්හාකං මාතරො ච ධීතරො ච කදා විහාරං ගන්ත්වා ධම්මං සුණිස්සන්ති? 12. කුතො ත්වං හත්ථිං ආනයො? 13. අම්හාකං ගාවියො අටවියං චරිත්වා කාසූසු පතිංසු 14. අසනි පබ්බතස්ස උපරි පතිත්වා තත්ථ හත් ථිං මාරෙයි 15. භගිනියා පාණිම්හි දද්දු අත්ථිං.

## 16 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. ධනවත්හු සහෝදරයන්ට ධනය දෙන්ට නොකැමැති වෙත්. 2. දන්දී සිල් රැක ස්වර්ගයෙහි උපදින්ට හැකි වෙත් 3. කුමරිතොමෝ ගිනි පෙනෙල්ලක් ගෙනවුත් බත් පිසන්ට ගිනි දල්වන්නේය 4. ස්ත්‍රීහු නුවරින් නික්ම දිය බොන්ට වැවේ ඉවුරට ගියහ 5. මුනුබුරෝ වනයෙන් ගෙඩි ගෙනවුත් කන්ට පටන් ගත්හ 6. සිල්වත් තාපස තෙම ධර්මය දේශනා කරන්ට පුටුවෙහි හුන්නේය 7. සොරා ආයුධයෙන් ගසා මගේ පියාගේ ඇඟිල්ල කැපුවේය 8. තරුණියෝ නෙළුම් මල් කඩා රැස් කරන්ට ගඟට ගොස් ඉවුරෙහි හුන්නාහ 9. අපි කූඩ ගෙන සොහොනට ගොස් මල් නෙලන්නෙමු 10. කන්‍යාව වස්ත්‍රයක් ගෙනෙන්ට කඩයට යන්නේය 11. නුඹලා වනයට ගොස් දෙනුන්ට දීමට කොළ ගෙනෙව් 12. අපි ඇස්වලින් රූප බලා සැපද දුකද ලබමු 13. නුඹ කණින් අසන්ටද නාසයෙන් ගඳ දැනගන්නට ද හැකිවෙහි 14. කිකිළියගේ බිජු ගසමුල ඇත්තාහ 15. නුවණැත්තෝ අමෘතය ලැබ මරණයට භය නොවෙත් 16. මිනිස්සු සිතින් සිතා පින් කරන්නාහ 17. තෙපි ධර්මය අසන්ට විහාරයට ගොස් වැල්ලෙහි හිඳිව් 18. ධනවත්හු රත්රන් දී නුවණ ලබන්ට නොහැකිවෙත් 19. දරුවා කූඩය ගන්ට හිණිමගට නැංගේය 20. මගේ සොහොයුරිය පින් ලබන්ට සිල් රකින්නේය

### පාලියට නැඟිය යුතු කොටස

1. දාරකා ඵලානි ඛාදිතුං රුක්ඛස්ස මූලං ගමිංසු 2. තරුණී පුප්ඵානි ඔ චිනිතුං රුක්ඛං ආරුහි 3. අහං ඡත්තං ච වත්ථං ච ආහරිතුං ගෙහං අගමිං 4. කුමාරි අග්ගිං ජාලෙතුං අලාතං යාචි 5. මයං අක්ඛීහි රූප නි පස්සිතුං සක්කොම 6. තුම්හෙ නාසාකාහි සායථ සොතෙහි සුණාථ 7. තෙ ධම්මං සොතුං ගන්ත්වා පුලිනෙ නිසිදිංසු 8. මනුස්සා මූලං දත්වා ඎණං කිණිතං න සක්කොන්ති 9. ධනවා අත්තනෝ ධනං භාජෙත්වා ධීතරානං ච පුත්තානං ච අදාසි 10. යුවතියෝ නදියං නහාතුං නගරා බහි අගමංසු 11. සත්තු ආයුධෙන

ප හරිත්වා මම සස්සුයා හත්ථං පිත්ථි 12. තෙ උය්‍යානං ගනත්වා දාරකානං පුප්ඵානි ච ඵලානි ච ආහරිංසු 13. සො ධෙනූනං දාතුං තිණං ච පණ්ණනි ච ආහරිංතු වනං අගමාසි 14. දාරකා ච දාරිකා ච චෙතියං පූජෙතුං පොක්ඛරණියා පදුමානි ආනෙසුං 15. අම්හාකං හාතරො ච හගිනියො ච වාපියං නහාත්වා භුඤ්ජිතුං ච සයිතුං ච ගෙහං අගමිංසු 16. දාරකො දීපිං දිස්වා උය්‍යානෙ තිරියං ධාවිත්වා නදිං තරි 17. තුම්හෙ දානෙන ච සීලෙන ච පුඤ්ඤං ලභථ 18. මය්හං මාතුල නියා ධෙනුයො සුසානෙ තිණං ඛාදිත්වා උදකං පාතුං වාපිං අගමංසු 19. තරුණියො(අත්තනො) භගිනීනං මාලා කාතුං පුප්ඵානි ආහරිංසු

## 17 වෙනි අභ්‍යාසය

### සිංහලට නැගිය යුතු කොටස

1. අපි දෙනගෙන් කිරිද, කිරෙන් දී(කිරි)ද දියෙන් ගිතෙල් ද ලබමු. 2. මව දුවගේ ඇස්වල කඳුළු දැක ඇගේ මුහුණ දියෙන් සේදුවේය. 3. කවරහෙයකින් නුඹ අද වැවට ගොස් නැවත ගඟට යන්ට කැමැත්තෙහිද? 4. තාගේ සහෝදරයෝ කෙසේ ගඟෙන් නෙළුම්මල් කඩා රැස්කොට ගෙනෙන්නාහුද? 5. ඒකාන්තයෙන් ඔවුහු දුනු ගෙන වනයට ඇතුළ්ව මුවන් මරා ගෙන් එන්නාහුය. 6. අපගේ පියවරු එකල්හි වනයෙන් මී පැණි ගෙනවුත් දී සමඟ අනුභව කළහ. 7. අපි හෙට තොප නැතිව වනයට ගොස් දර කඩන්නෙමු 8. කුමාරයෝ ඉක්මනින් දුව වැවෙහි ක්‍රීඩා කොට හෙමින් ගෙවලට ආවාහුය 9. නුඹලා කිරි බොන්ට කැමතිවව්ද නැතහොත් දී(කිරි) අනුභව කරන්ට කැමැතිවව්ද? 10. යම්තාක් මාගේ පියා නහන්නේද ඒතාක් මම මෙහි සිටිමි 11. යම්සේ රජතෙම අණ කරයිද තෝ එසේ කරව 12. එසේය මම රජුගේ වචනය ඉක්මවන්ට නොහැක්කෙමි.

### පාලියට නැගිය යුතු කොටස

1. තුම්හෙ ඛීරං පාතුං ඉච්ඡථ, අථවා දධිං භුඤ්ජිතුං? 2. අහං පඨමං යාගුං පිච්ඡා පුන මධුනා සහ දධිං භුඤ්ජිස්සාමි 3.

ආපණං ගන්ත්වා ඛිප්පං දධිං ආනෙහි 4. සින්ධුම්හි නහාත්වා ආගන්ත්වා, ඉදානි පුන කිමත්ථං තත්ථ ගමිස්සසි? 5. අම්හාකං භාතරෝ කථං වනම්හා මධුං ඔචිනිංසුති ත්වං ජානාසි? 6. යාව ත්වං ගංගං තරිත්වා ආගච්ඡසි තාව අහං කුලෙ ඨස්සාමි 7. මය්හං සස්සු පරිසං විනා නගරං ගන්ත්වා භගිනියා සද්ධිං ආගමි 8. සෙඨී රඤ්ඤෝ පාදෙසු පතිත්වා රාජානං වන්දි 9. කිං තව අස්සෝ සීඝං ධාවිතුං සමත්ථෝ හොති? 10. ආමසෝ අඩ්ඩා සීඝං ධාවිස්සති 11. ගාමෙ මනුස්සා ධනූනි ගහෙත්වා වනං ගන්ත්වා හත්ථිං මාරෙත්වා තස්ස දාඨා පින්දිංසු 12. කස්මා තව පිතා වාලිකාය උපරි සනිකං චරති?

## 18 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. සියල්ලන්ගේ මුනුබුරෝ නුවණැත්තාහු නොවෙත් 2. සියලු ස්ත්‍රීහු වැවෙහි නා නෙළුම්මල් පැළඳ ආවාහුය 3. වෙළෙන්දා සියලු ධනය සිඟන්නන්ට දී වෙන රටකට ගියේය 4. මව්තොමෝ දූවරුන් දෙදෙනට ම වස්ත්‍ර මිලට ගෙන දෙන්නේය 5. කවරෙක් ගඟටත් වැවටත් අතරින් දෙන ගෙන යයිද? 6. කවරෙකුගේ පුතා දකුණු දිසාවට ගොස් වී ගෙන එන්නේද? 7. යම්කෙනෙක් පව් කරත්ද ඔවුහු නිරයෙහි ඉපද දුක් ලබන්නාහුය 8. කවර ස්ත්‍රීන්ගේ දූවරු වනයෙන් දර ගෙනවුත් බත්පිසන්නාහුද? 9. කවර මගකින් ඒ පුරුෂ තෙම නුවරට ගොස් බඩු මිල්දී ගත්තේද? 10. අනික් දැරිතොමෝ ස්ත්‍රියගේ අතින් මල් ගෙන දාගැබට පිදී 11. අනුන්ගේ වස්තුව හෝ ධාන්‍ය හෝ ගන්ට නොසිතව් 12. අනිකා අනික් වැවෙහි නා නැගෙනහිර දිසාවෙන් නගරයට ඇතුළ්විය.

### පාලියට නැඟිය යුතු කොටස

1. ගෙහානි චවීථියෝ ච උය්‍යානානි ච පස්සිතුං සබ්බෙ නගරං පවිසිංසු 2. ගාමෙ සබ්බාසං ඉත්ථිනං ධීතරෝ මග්ගෙන චෙතියං අගමංසු 3. අපරා කඤ්ඤා පදුමං ගහෙත්වා අඤ්ඤතරිස්සා අදාසි 4. කො මෙ බීරං වා දධිං වා ආහරති? 5. කෙ ගඬගාය තීරෙ ඨත්වා දක්ඛිණං දිසං ඔලොකෙන්ති? 6. සබ්බෙසං ධනවන්තානං

පුත්තා සදා ධනවන්තො න භවන්ති 7. කෙසං නත්තාරො ධෙනුයො ඉධ ආනෙත්වා ඛාදිතුං තිණානි අදංසු? 8. සුවෙ නගරම්හි සබ්බා ඉත්ථියො බහි ආගනත්වා වනම්හි චරිස්සන්ති 9. ඉතරා ඉත්ථී විසිකාය දීපිං දිස්වා උය්‍යානෙ තිරියං ධාවී 10. දානෙන පුඤ්ඤං ඔවිනන්තා සග්ගෙ නිබ්බත්තිස්සන්ති 11. අඤ්ඤතරො පුරිසො පොක්ඛරණියා පදුමානි ආනෙසි, අඤ්ඤෙ පුරිසො තානි වික්කිණිතුං ආපණං හරි 12. මය්හ භාතු පුත්තො පුෂ්ඵානි පණ්ණානි, ඵලානි ච ඔවිනිතුං ඉතරස්ස රුක්ඛස්ස සංඛායො භඤ්ජි.

## 19 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. මේ සිංහතෙම ඒ වනයෙන් නික්ම මේ මාර්ගයෙහි එක් ස්ත්‍රියක මැරුවේය. 2. හෙතෙම ඒ තරුණියන්ට ඒ වස්ත්‍ර විකුණා මුදල් ලබන්නේය 3. මැගේ දූවරු මේ වනයෙන් මේ ගෙඩි ගෙනාවාහුය; අනික් ස්ත්‍රීහු ඒවා කෑම පිණිස ගත්හ 4. මේ සියලු තරුණියෝ ඒ විහාරයට ගොස් ධර්මය අසා බුදුන් වඳින්නාහුය 5. මේ මිනිස්සු යම් පින් හෝ පව් හෝ කරත් නම් ඒවා ඔවුන් අනුව යත්. 6. ඒ කන්‍යාවගේ මව් දකුණු දිසාවෙන් මේ ගමට අවුත් මෙහි බොහෝ කලක් වසන්නේය 7. ඔහුගේ මුණුබුරා මොහුගේ සහෝදරයා සමග නුවරට ගොස් ඒ බඩු මිලදී ගන්නේය 8. ඒ ස්ත්‍රීහු අර සියලු කුමරියන්ගේ අත් වල නෙළුම් මල් තැබූහ 9. ඒ රූ පිනියගේ ඒ දාසීහු මේ ගස් වලින් මේ මල් කඩා රැස් කොට මේ මල් දම් කළාහුය 10. හෙතෙම මේ ධනය කවුරුන්ට දී සැප ලබන්නේද? 11. යමෙක් මාර්ගයෙහි යයිද ඔහුගේ පුතා රා බී මෙහි නිදයි 12. කවරහු ඒ කෙතට ගොස් තණ ගෙනවුත් මේ දෙනුන්ට දී කිරි ලබන්ට කැමති වෙත්ද?

### පාලියට නැඟිය යුතු කොටස

1. අඤ්ඤතරො පුරිසො තං සුසානං ගන්ත්වා තානි පුප්ඵානි ඔචිනිත්වා ඉධ ආනෙසි 2. අයං සීහී තම්හා වනම්හා බහි ආගන්ත්වා

එකා ධෙනුං මාරෙසි 3. එතාය වනිතාය භත්තා එතස්මා ආපණා ඉමානි වත්ථානි ආහරිත්වා තස්ස නත්තාරානං අදාසි 4. තව ච මම ච භණ්ඩානි ආහරිතුං කො කොළම්බනගරං ගමිස්සති? 5. සුවෙ තස්ස භාතරො තං වනං ගන්ත්වා මධුං ච ඵලානි ච ඔචිනිස්සන්ති 6. තස්සා භගිනියෝ ඉමාසං ධෙනූනං තිණානි ආහරිතුං එතං ඛෙත්තං අගමිංසු 7. අහං ඉමානි පදුමානි පුප්ඵානි ච එතස්මිං ගාමෙ අඤ්ඤතරාය ඉත්ථියා ලභිං 8. අජ්ජ ඉමස්මිං නගරෙ සබ්බා යුවතියො එතං නදිං ගන්ත්වා තත්ථ නහායිස්සන්ති 9. තෙ තෙසං වාණිජානං ගාවියො වික්කිණිත්වා තෙන මූලෙන වත්ථානි මාලා ඡත්තානි ච තිණිංසු 10. තෙතානි භණ්ඩානි එතස්මිං ආපණෙ එකස්ස වාණිජස්ස දාතුං ආහරිංසු 11. කෙ හීයො ඉමස්මිං වනෙ සිහං මාරෙසුං? 12. කා ඉත්ථ තස්සා මාලං චොරෙත්වා විසිඛායං ධාවි?

## 21 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. ගමට යන්නාවූ ළමයා එක් ගොනකු දැක භයවීය 2. ගෑනු ළමයා අඬමින් මෑණියන් සමීපයට ගොස් පුටුවෙහි හුණි 3. වෙළෙන්දෝ බඩු විකුණන්නාහු ගඟෙහි නාන මිනිසුන් දුටුවාහුය 4. කන්‍යාවෝ සිනාසෙමින් නාන්නාහු යන්නාවූ ස්ත්‍රියට බැන්නාහුය 5. මිනිහා සිනාසෙමින් ගසට නැග ගෙඩි කමින් අත්තෙහි උන්නේය 6. භාග්‍යවතුන්වහන්සේ සැවැත්නුවර වාසය කරන සේක් දෙවියන්ට ද මිනිසුන්ට ද ධර්මය දේශනාකළසේක 7. ඕතොමෝ නිදන්නා වූ ස්ත්‍රිය නැඟිටුවා සිනා සෙමින් එතැනින් ඉවත් විය 8. නුඹලා බිම නිදන්නා වූ මේ දරුවා ඇඳෙහි තබව් 9. සිංහයා දැක බය වී දුවන්නා වූ ඒ මුවෝ මේ වනයෙහි වළ්වල වැටුණාහ. 10. මේ ගමේ වසන්නා වූ පුරුෂයන් අතුරෙන් එකෙක් වනයට යන්නේ වළක වැටුණේය 11. හින්නා වූ ස්ත්‍රියගේ පුත්‍රයා අඬමින් ඇගේ සමීපයට යන්නේය 12. සිඟන්නෝ බත් පිසන්නා වූ ස්ත්‍රියගෙන් ආහාර ඉල්ලමින් එහි උන්හ 13. වනයෙන් දර ගෙන එන්නා වූ

කන්‍යාතොමෝ දිය බොමින් එක් ගලක් උඩ හුණි 14. වෙළෙන්දෝ බඩු ගනිමින් ද විකුණමින්ද ගම්වලද නුවර වලද ඇවිදිත්

## පාලියට නැඟිය යුතු කොටස

1. දාසෝ නදිං ගච්ඡන්යතෝ ඵලානි ඛාදමානෝ රුක්ඛස්ස මූලෙ නිසීදි 2. මාතා රුදන්තිං දාරිකං උක්ඛිපිත්වා පිවිතුං ඛීරං අදාසි 3. මයං නදියා තිරෙ ආහිණ්ඩන්තා නදියං නහායන්තෙ මනුස්සෙ පස්සිම්හ 4. මීගො තත්ථ තිට්ඨන්තෙ අම්හෙ දිස්වා ධාවිත්වා කාසුයං පති 5. වනම්හා බහි නික්ඛමන්තෝ සීහෝ ඛෙත්තෙ තිණං ඛාදන්ති ධෙනුං පස්සි 6. අස්මා වනම්හා දාරුං ආහරන්ති කඤ්ඤ, එතාය වාපියා උදකංපිවි 7. අස්මිං ගාමෙ වසන්තෝ පුරිසෝ එතං පබ්බතං ධාවන්තං සීහං පස්සි 8. අම්හාකං පිතරෝ ච භාතරෝ ච භණ්ඩානි වික්කිණන්තා කිණන්තා ව ගාමෙසු චරිස්සන්ති 9. තදා පබ්බතස්ස උපරි තිට්ඨන්තෝ අහං ගුහායං සයන්තිං සීහිං පස්සිං 10. දාරකෝ හසන්තෝ ධාවිත්වා මං ආගමි 11. කස්සකෝ දුනුහිං හරන්තෝ ඉමෙ රුක්ඛෙ ඉමානි ච ඛෙත්තානි ඔලොකෙන්තෝ ඉමස්මිං පාසාණෙ නිසීදි 12. සත්ථා සාවත්ථියං චිරං වසන්තෝ තස්මිං නගරෙ මනුස්සානං ධම්මං දෙසෙසි 13. තස්ස භගිනී තස්සා භාතරානං හත්තං පචමානා පීථෙ නිසීදි 14. යාචකානං දානං දදන්තෝ සෙට්ඨී අත්තනෝ සබ්බං ධනං අදාසි

## 22 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. සුදු දෙන්නු කෙතෙහි ඇවිද බොහෝ තණකොළ කෑවාහුය 2. මගේ මව නිල් උපුල් ගෙනවුත් චෙත්‍යයට පූජා කළාය 3. අපි හෙට රත් පියුම් කඩන්ට ඒ වැවට යන්නෙමු 4. සුදු වූද රතු වූද ගොන්නු තණ කෑම පිණිස වනයෙහි ඇවිදිත් 5. හෙතෙම මිටි පුටුවක් ගෙනවුත් බිම තබා එහි උන්නේය 6. උඹේ පියා මහත් ගසක් කපා හෙළුවේය 7. මේ විහාරයෙහි මහත් චෙත්‍යයක් තිබේ

8. දාස තෙම දික් රැණකින් රතු දෙනකු ගසෙහි බැන්දේය 9. ඒ වනයෙහි බොහෝ උස් ගස් ඇත්තාහ 10. නුවණ ඇති පුරුෂයාගේ බාල වූ දියණි තොමෝ පැසුණු ගෙඩි ගෙනවුත් ළමයින් ටික දෙනෙකුට දුණි 11. ඒ මහලු ස්ත්‍රියගේ මුනුබුරා නොගැඹුරු දියෙහි නායි 12. බලවත් කළු ගොන්නු උස් පර්වත වල ඇවිද බොහෝ කොළ කත් 13. මල් දම් ඇති ස්ත්‍රී තොමෝ කොට මගින් කුඩා ගමට යයි 14. බාල වූ කන්‍යා තොමෝ මෘදු අතින් සුදු නෙළුම් ගනී 15. බොහෝ අඥානයන්ගේ පුත්‍රයෝ ඒ ගඟෙහි ගැඹුරු දියෙහි වැටී මැරෙන්නාහුය 16. මගේ සහෝදරයන් අතුරින් මධ්‍යමයා උස් පුටුවක හිඳ අමු ගෙඩි කයි.

## පාලියට නැඟිය යුතු කොටස

1. සෙතා ච රත්තා ච ගොණා තිණානි ඛාදන්තා බුද්දකෙ ඛෙත්තෙ තිට්ඨන්ති 2. කාළා ගාවී එතාය මහතියා වාපියා බහුං උදකං පිවි 3. බහු කඤ්ඤයො රත්තානි වත්ථානි නිවාසෙත්වා තස්මිං මහා නගරෙ මහන්තං ආපණං අගමංසු 4. එතාය මහල්ලිකාය ඉත්ථියා සබ්බෙ පුත්තා බලවන්තා වා ධනවත්තා වා නහවන්ති 5. අම්හාකං දාරකා නිච්චං ආමකඵලානි ඛාදිතුං ඉච්ඡන්ති 6. සාඛාලා ඉත්ථී විත්ථතං නදිං ගන්ත්වා තස්මිං ගම්භිරෙ ජලෙ පති 7. මයං දීඝෙන මග්ගෙන බුද්දකං ගාමං පත්වා තස්මිං මහතියා සාලාය අට්ඨම්හ 8. බහු ඉත්ථියො උච්චෙහි රුක්ඛෙහි පක්කානි ඵලානි ආහරිත්වා ආපණෙසු වණිජානං වික්කිණිංසු 9. දාරකො නීචං රුක්ඛං ආරුහිත්වා තස්මිං සෙතානි පුප්ඵානි ඔචිනි 10. බලවා පුරිසො එතස්මිං බුද්දකෙ උය්‍යානෙ උච්චෙ නිචෙ ච රුක්ඛෙ ඡින්දි 11. කාළා ගොණා උච්චස්ස පබ්බතස්ස සමීපෙ ඛරාය භූමියා සයන්ති 12. බහවො මනුස්සා මහන්තා සින්ධුං තරිත්වා ඉමං සුන්දරං දීපං ආගච්ඡන්ති 13. අස්මිං මහති නගරෙ මහන්තානි ගෙහානි, විත්ථතා විසිඛා, දීඝා මග්ගා, බහූති උය්‍යානානි ච සන්ති 14. දාරකස්ස මුදු පාණි එතස්ස දීපස්ස සිඛාය ඩය්හි 15. දාසෙ එතිස්සා දීඝාය නදියා තිරෙ බුද්දකම්හා ඛෙත්තම්හා බහුං තිණං ආහරි.

# 23 වෙනි අභ්‍යාසය

## සිංහලට නැඟිය යුතු කොටස

1. පුරුෂයෝ සතර දෙනෙක් පොරෝ සතරකින් ගස් සතරක් කපන්නාහුය 2. ඒ ස්ත්‍රීහු තිදෙනා මේ මාර්ග තුනෙන් ඒ වනයට ගොස් කන්‍යාවන් තුන් දෙනෙකුන්ට ගෙඩි තුනක් දුන්නාහුය 3. එක් ශාලාවක සියයක් පුරුෂයෝද පනසක් ස්ත්‍රීහුද හින්නාහුය 4. අපි මෙයින් නව දිනකින් කුමරුන් පස් දෙනෙකුන් සමග කොළඹට යන්නෙමු 5. දාසයෝ පස් දෙන අශ්වයන් දශ දෙනෙකුන්ට බොහෝ තණද මදක් දියද ගෙනාවාහුය 6. පුරුෂයෝ විසි දෙනෙක් ගොනුන් දශ දෙනෙකුන් කරණ කොට කුඹුරු සතරක් සීසාත් 7. වෙළෙන්දා රුපියල් දෙසියයකින් අසුන් අට දෙනෙකුන් මිලට ගෙන ධනවතුන් සතර දෙනෙකුන්ට වික්කේය 8. ඒ ස්ත්‍රීන් සය දෙනාගේ සහෝදරයෝ සය දෙන විශාල කන්දකට නැඟී වඳුරන් සය දෙනෙකුන් ගෙනාවාහුය 9. ඈලාගේ මව් තොමෝ අඹ දසයක් මිල්දී ගෙන දූවරුන් සතර දෙනෙකුන්ට දෙන්නේය 10. දැන් ලක්දිව සතළිස් පන් ලක්ෂයක් මිනිස්සු වසත් 11. නුඹලා මෙයින් අවුරුදු දෙකකින් අනුරාධපුරයට ගොස් නව දිනක් එහි වසමින් විශාල චෛත්‍යයන් බලන්නාහුය 12. දාසයා එක් අතකින් පොල් ගෙඩි දෙකක්ද අනික් අතින් කොස් ගෙඩියක්ද ගෙන එයි

## පාලියට නැඟිය යුතු කොටස

1. චතස්සො ඉත්ථියො අට්ඨ අම්බානි ආනෙත්වා ද්වින්නං ධීතූනං අදාසි 2. සුවෙ පඤ්ච මනුස්සා වනං ගන්ත්වා පඤ්චහි එරසූහි දස රුක්ඛෙ ඡින්දිස්සන්ති 3. තිස්සො කුමාරියෝ තිස්සො වාපියො ගන්ත්වා තිංසති පුප්ඵානි ආහරිංසු 4. ඉමිස්සා සාලාය පඤ්චසතං මනුස්සා තිසතං ඉත්ථියො ච තිට්ඨන්ති 5. අස්මිං නගරෙ පඤ්ච සහස්සා මනුස්සා සහස්සා ගොණා පඤ්චසතං ගෙහානි ච සන්ති 6. පඤ්චන්නං කඤ්ඤානං සත්ත භාතරො එතං වනං ගන්ත්වා අට්ඨ මිගෙ මාරෙසුං 7. මයං නව වස්සෙ අට්ඨ ච මාසෙ කොළම්බ නගරෙ වසිම්හ 8. පිතා තිණි වත්ථානි කිණිත්වා අත්තනො

තිස්සන්නං ධීතරානං අදාසි 9. දස මනුස්සා වීසති ගොණෙ අදාය පඤ්ච බෙත්තෙ කයන්ති 10. සට්ඨී හත්ථිනො නගරම්හා බහි ආගතා තෙසු තිංසති වනං පවිසිංසු 11. මයා කීතානං වාදසන්නං අස්සානං එකං එකස්ස මනුස්සස්ස චික්කිණිං 12. දාසො ද්වාදස නාළිකෙරෙ ආහරිත්වා තතො දස අඤ්ඤතරිස්සා ඉත්ථියා චික්කිණි 13. තයො වාණිජා රූපියානං තිසතෙන තයො අස්සෙ කිණිංසු 14. ලඬකායං පඤ්ඤාසසත සහස්සං මනුස්සා සන්ති

## 24 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟිය යුතු කොටස

1. යන්නාවූ පුරුෂයන් දසදෙන අතුරෙන් සත්වැන්නා වෙළෙන්දෙකි 2. ඔහුගේ සත්වෙනි දියණිතොමෝ අට වැන්නියට වස්ත්‍රයක් දුණි 3. තරුණියන් සතරදෙන අතුරෙන් තුන්වැන්නියගේ සහෝදරයා අසුන් පස් දෙනෙකුන් ගෙනාවේය 4. මගේ පියා සැත්තෑවෙනි අවුරුද්දේ පස්වෙනි මාසයෙහි මළේය 5. අපි මෙයින් හය වෙනි අවුරුද්දේ පුරුෂයන් සතර දෙනෙකුන් සමග දෙවෙනි නුවරට යන්නෙමු 6. අට වෙනි එඩ්වඩ් නම් රජ තෙමේ ඔහුගේ පළමුවෙනි සහෝදරයාට රාජ්‍යය දී සිහසුනෙන් ඉවත් වූයේය 7. සය වෙනි පරාක්‍රමබාහු රජ තෙම පෙර ලක්දිව කෝට්ටේ නුවර රජය කෙළේය 8. මේ පාසැලේ අසූවක් ශිෂ්‍යයන් අතුරෙන් විසි පස් වැන්නා ඊයේ ගැඹුරු දියෙහි වැටුණි 9. අපගේ පියවරු මෙයින් පස් වෙනි අවුරුද්දේ බොහෝ මිනිසුන් සමග අනුරාධපුරයට යන්නාහ 10. පාසැල් දෙක අතුරෙන් පළමු පාසැලෙහි තුන්සියයක් ශිෂ්‍යයෝ උගනිත් 11. ධනවතුන් දෙදෙන අතුරෙන් දෙවැනියා හිඟන්නන් තිස් දෙනෙකුට දන් දුණි 12. නාන්නා වූ ස්ත්‍රීන් පස් දෙන අතුරෙන් තුන්වැන්නියගේ ස්වාමියා ධනවතෙක් වේ 13. බත් පිසන ස්ත්‍රීන් තුන් දෙන අතුරෙන් දෙවෙනි ස්ත්‍රී නාන්ට යන්නේය 14. භාග්‍යවතුන් වහන්සේ පළමු(වෙනි) අවුරුද්දේ බරණැස ඉසිපතනාරාමයෙහි විසූසේක 15. එකල්හි උන් වහන්සේ භික්ෂූන් පස් දෙනෙකුන්ටද බොහෝ මිනිසුන්ට හා දෙවියන්ටද පළමු කොට ධර්මය දේශනා කළහ.

### පාලියට නැඟිය යුතු කොටස

1. දසසු වාණිජෙසු පඤ්චමො මණිං කිණිස්සති 2. චතුත්ථො ධනවා ඉතො තතියෙ දිවසෙ යාචකානං සතස්ස දානං දස්සති 3. තිස්සන්නං පාඨසාලානං පඨමාය අට්ඨසතං සිස්සා සන්ති 4. මම චතුත්ථො භාතා කොළම්බ නගරෙ පඤ්චමියා විසිඛාය ඡට්ඨෙ ගෙහෙ වසති 5. මයං දුතියෙ වස්සෙ තතියස්ස මාසස්ස සත්තමෙ දිවසෙ නගරං ගමිස්සාම 6. තස්ස දසමො පුත්තො ඡට්ඨෙ මාසෙ පඤ්ච වීසතිමෙ දිනෙ ඉධ ආගච්ඡිස්සති 7. සත්තසු ඉත්ථීසු ඡට්ඨා රත්තං වත්ථං, පඤ්චමා නීලං වත්ථං ච පරිදහති 8. සත්තමස්ස එඩ්වඩ් නාමස්ස භූපතිනො පුත්තො පඤ්චමො ජෝර්ජ්රාජා ඉතො තිණ්ණං වස්සානං උපරි කාලමකාසි 9. තතො තස්ස පඨමො පුත්තො අට්ඨමො එඩ්වඩ් ඉති නාමෙන රාජා අහවි 10. අහං ඉමෙසං අට්ඨන්නං අස්සානං දුතියං රූපියානං ලිහි සතෙහි කිණිස්සාමි 11. ඉමිස්සං පාඨසාලායං අසීතියා සිස්සෙසු වීසතිමො හීයො කලමකාසී 12. මය්හං ඡට්ඨො භාතා චතුත්ථෙන සඬ්ං දසමෙ දිවසෙ ඉධ ආගමිස්සති 13. තස්ස තතියස්ස භාතුනො දුතියා ධීතා ඉමායං පාඨසාලායං උග්ගණ්හාති 14. රාජදෙවියා පඨමා භගිනී ඉතො තීහි මාසෙහි අනුරාධපුරං පස්සිතුං ගමිස්සති 15. දුට්ඨගාමිණී භූපති චතුවීසති වස්සානි අනුරාධපුරෙ රජ්ජං අකාසි

## 25 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. මේ ධනවතුන් දසදෙන අතුරෙන් පස්වෙනියා සැපසේ ජීවත් වෙයි. 2. මේ දිවියා හෙමින් අවුත් වහා දෙන මතුපිටට පැන්නේය. 3. කන්‍යාවන් අට දෙන අතුරෙන් සය වෙනි කන්‍යාව දෙන තදින් බැඳ වැවට ගෙන ගියාය. 4. මේ දරුවෝ පස් දෙන නිතරම මග දුවමින් ක්‍රීඩා කරත්. 5. මේ ශිෂ්‍යයන් නවදෙන අතුරෙන් පස් වෙනියා මනාකොට උගනියි. 6. භික්ෂූහු බුදුරදුන් ළඟට අවුත් වැඳ එකත් පසක හුන්නාහුය 7. ඒ සිටුතෙම ධනය පසක් කොට බෙදා දියණියන් පස් දෙනාට දුන්නේය 8. ඔහුගේ හයවැනි දුවගේ

පුතා දෙවරක් මේ නුවරට ආවේය 9. පළමුකොට ඒ අශ්වයෝ රථය සමලෙස ඇද්දාහුය, දෙවනුව ඉක්මනින් දිව්වාහුය 10. ඒ වෙළෙන්දෝ සතර දෙන කෙසේ එහි වසමින් බඩු විකුණත්ද? 11. හෙතෙම දුවට මෙසේ කියා වහා වෙනින් තැනකට ගියේය.

### පාලියට නැඟිය යුතු කොටස

1. තෙ දස දාරකා අභිණහං එත්ථ කීළන්ති 2. ඉමෙසු සත්තසු කස්සකෙසු චතුත්ථො සුඛං ජීවති 3. රාජා වික්ඛත්තුං නගරා නික්ඛම්ම ඉමිස්සං වාපියං නහායි 4. අස්සා සමං රථෙ ආකඩ්ඪන්තා සීඝං ධාවන්ති 5. ඉමෙසං ඡන්නං භික්ඛූනං තතියො සාධුකං සීලානිත රක්ඛති 6. තෙ ද්වාදස වාණිජා භගවතො සන්තිකං ගන්ත්වා ධම්මං සොතුං එකමන්තං නිසීදිංසු 7. චොරො සහසා ආගන'ත්වා මය්හං ඡත්තං අදාය ධාවි 8. මම මිත්තස්ස පඤ්චසු පුත්තෙසු තතියො දුක්ඛං උග්ගණ්හාති 9. තෙ සනිකං ගංගාතිරං ගන්ත්වා තත්ථ චරිත්වා විසුං පච්චාගච්ඡිංසු 10. තස්ස ඡට්ඨස්ස භාතුනෙ දුතියා ධිතා සීඝං උග්ගණ්හාති 11. කස්සකො ගොණං දළහං බන්ධිත්වා ඛෙත්තං නෙත්වා තං කසි 12. රාජා රජ්ජං චතුධා විභජිත්වා චතුන්නං පුත්තානං අදාසි

## 26 වෙනි අභ්‍යාසයෙහි විවරණය කළයුත්තක් නැත

## 27 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. කන්‍යාව විසින් බත පිසනු ලැබේ 2. ගවයෝ දාසයන් විසින් ගසනු ලැබෙත් 3. තෝ බලවත් පුරුෂයකු විසින් අදිනු ලැබෙහි 4. අපි අපගේ සතුරන් විසින් මරනු ලැබෙමු 5. ඒ මුවෝ ඒ දාසිය විසින් බඳිනු ලැබෙත් 6. මේ වඩුවා විසින් මේ ගමෙහි බොහෝ ගෙවල් සාදනු ලැබෙත් 7. තොපි ඒ ගමෙහි මිනිසුන් විසින් බඳිනු ලැබෙහු 8. අපගේ බඩු ඔවුන්ගේ දාසයන් විසින් ගමට ගෙනයනු ලැබෙත් 9. වෙළඳුන් අටදෙනකු විසින් අශ්වයෝ සතරදෙනෙක් නුවරට ගෙනෙනු ලැබෙත් 10. අපි අපගේ දූවරුන්

ද මුනුබුරන් ද විසින් වඳිනු ලැබෙමු 11. ඒ විශාල කුඹුර ගොවියන් පස්දෙනකු විසින් සීසානු ලැබේ 12. ස්ත්‍රියගේ බොහෝ රෙදි ඒ පොකුණෙහි සෝදනු ලැබෙත් 13. සිටුවරයා විසින් බොහෝ සිඟන්නන්ට දන් දෙනු ලැබේ 14. ඒ ආරාමයෙහි වසන්නාවූ භික්ෂූන් විසින් සිල් රකිනු ලැබේ 15. භික්ෂූන් සයනමක් විසින් පන්සියයක් මිනිසුන්ට ධර්‍මය දේශනා කරනු ලැබේ 16. මිනිසුන් පණසක් විසින් ඒ වෙළඳසැලින් බොහෝ බඩු මිලදී ගනු ලැබෙත් 17. ස්ත්‍රීන් දසදෙනකු විසින් අඹ දෙසියයක් විකුණනු ලැබේ 18. දාසිය විසින් පිසනලද බත ගෘහපතියා විසින් අනුභව කරනු ලැබේ.

## පාලියට නැඟියයුතු කොටස

1. මාතරා පුත්තො හත්ථෙහි ගණ්හීයති 2. බුද්ධෙන දෙවානං මනුස්සානං ච ධම්මො දෙසිතො 3. දාසෙහි දීඝාහි රජ්ජූහි ධෙනුයො බන්ධා 4. අයං ගෙහො අට්ඨහි වඩ්ඪකීහි කතො 5. තස්මිං වනෙ වීහි දීපිහි නව ගාවියො මාරිතා 6. බලවන්තෙහි පුරිසෙහි ඉමං ඛෙත්තං ආකඩ්ඪීයසි 7. ඉහි ධනවන්තෙහි ඉමෙ කාළා අස්සා කිණිතා 8. තුම්හෙ චතූහි මනුස්සෙහි පහරියථ 9. තෙහි වීහි වාණිජෙහි අස්මිං ගාමෙ බහූනි භණ්ඩානි වික්කිණිතානි 10. දාරකො තස්ස මාතරා වෙජ්ජස්ස සන්තිකං ආනීතො 11. අස්මිං විහාරෙ භික්ඛූහි අසමිං ගාමෙ මනුස්සානං ධම්මො දෙසිතො 12. දාසියා පක්කො ඔදනොතස්සා පුත්තෙහි භාතරෙහි ච භුත්තො 13. තාහි ඉත්ථීහි ඉමායං වාපියං බහූනි රත්තානි වත්ථානි ධොවීයන්ති 14. ඡහි උච්චාහි වනිතාහි අම්බානං තිසතං වික්කිණිතං 15. ඉමස්මිං ඛෙත්තෙ සබ්බං තිණං අට්ඨහි ගොණෙහි චතූහි ච ධෙනූහි ඛාදිතං 16. බුද්ධො අස්මිං දීපෙ බහූහි වන්දියති 17. ඵාදසහි කස්සකෙහි අට්ඨහි ච ගොණෙහි ඉමෙ ඛෙත්තානි කසීයන්ති 18. මග්ගෙ ගච්ඡන්තස්ස මනුස්සස්ස පුත්තො බලවන්තෙහි මනුස්සෙහි පහටො.

## 28 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. කන්‍යාව විසින් පිසනලද බත බල්ලා විසින් කන ලදී 2. පුරුෂයා විසින් කපනු ලබන ගස ගෙය මත්තෙහි වැටෙන්නේය 3. ස්ත්‍රිය විසින් අනුභව කරනු ලබන ආහාරය සිඟන්නාටද දිය යුතුය 4. පුත්‍රයන් විසින් ද දූවරුන් විසින්ද මව්වරුත් පියවරුත් වඳින ලද්දාහුද පුදනු ලද්දාහුද වෙත් 5. සියල්ලන් විසින් බුදු රද වැන්ද යුතුද පිදිය යුතුද වෙයි 6. සොරුන් විසින් ගෙන යන ලද අශ්වයෝ හිමියන් විසින් නැවත ගෙනෙන ලද්දාහු වෙත් 7. රියැදුරා විසින් ගසනු ලබන්නා වූ අශ්ව තෙම වහා දුවයි 8. තොප විසින් දන් දිය යුත්තාහ, සිල් රැකිය යුත්තාහ, පින් කළ යුත්තාහ. 9. මා විසින් දෙනු ලබන දේ අනුභව කරන්ට බොහෝ යාචකයෝ ආවාහුය 10. ස්ත්‍රී තොමෝ සේදිය යුතු රෙදි ගෙන ගඟට ගියාය 11. තරුණියෝ මව විසින් කියන ලද කථාව අසා කන්‍යාව විසින් ගෙන යනු ලබන මල් නොගත්තාහුය 12. අප විසින් දෙන ලද වස්ත්‍ර භික්ෂූන් විසින් ගෙන යන ලද්දාහු වෙත් 13. ඊයේ සර්පයා විසින් දෂ්ට කළ ළමයා වෙදා වෙතට ගෙන යන ලද්දේ වෙයි 14. භික්ෂූන් විසින් ධර්මය දේශනා කළ යුතුය, මිනිසුන් විසින් ඇසිය යුතුය

### පාලියට නැඟිය යුතු කොටස

1. දාරකෙන බාදිතං ඵලං අඤ්ඤස්ස න දාතබ්බං 2. චතූහි කස්සකෙහි තෙසං ගොණෙහි සද්ධිං ඛෙත්තං කසි තබ්බං 3. අරිනා පහටෝ මනුස්සෝ කත්තබ්බං න දිස්වා ඛෙත්ත තිරිය ධාවී 4. ධනවතා වාණිජෙන දියමානංදානං ලහිතුං බහවෝ යාචකා ආගමිංසු 5. තුම්හාකං මාතාපිතරෝ තුම්හෙහි වන්දිතබ්බා ච පූජෙතබ්බා ච ගොන්ති 6. ගුරුනා වුත්තං සුතා සිස්සාවත්තබ්බං න පස්සිංසු 7. වාණිජෙහි නීතා අස්සා හීයෝ වික්කිණිතා 8. දාසෙ පහටෝ ගොණෝ සීඝං ඛෙත්තං ධාවී 9. අම්හෙහි සීලං රක්ඛිතබ්බං, දානං දාතබ්බං ධම්මෝ සුණිතබ්බෝ ච හාති 10. අම්හාකං මිත්තෙහි බහූනි සෙතානි වත්‍ථානි ධොවිතබ්බානි හොන්ති 11. උය්‍යානෙ පින්දිතබ්බා බහූ රුක්ඛා තෙහි මනුස්සෙහි පින්දියන්ති 12. තෙහි ඡින්නා රුක්ඛා

හත්ථීහි ආකඩ්ඪියන්ති 13. අම්හෙහි පක්කං භත්තංඛෙත්තේ තිට්ඨන්තානං හරිතබ්බං 14. ගාමං ගතානං වාණිජානං භුඤ්ජිතබ්බො ආහාරො න අහොසි (ගාමං ගතා වාණිජා භුඤ්ජිතබ්බං ආහාරං ලභිංසු)

## 29 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. සිටුතෙම වඩුවා ලවා ගෙවල් සාදවයි 2. මව්තොමෝ දරුවා පොකුණට ගෙනගොස් නාවන්නේය 3. අපගේ පියවරු විහාරයට ගොස් භික්ෂූන් වැලඳෙව්වාහුය 4. ඒ ස්ත්‍රීහු දාසීන් ලවා බත පිසවත් 5. පව් කරන්නාවූ පුරුෂයෝ තමාගේ දාසයන් ලවා බොහෝ මුවන් මරවත් 6. ගෘහපතීහු පුරුෂයන් ලවා දරුවන් ගන්වයි 7. ගුරුවරයා බොහෝ ශිෂ්‍යයන්ට ධර්මය උගන්වයි 8. අධිපතියා දාසයන් ලවා උයනෙහි බොහෝ ගස් කප්පවයි 9. මම ඒ කන්‍යාවන් ලවා කඩයෙන් බඩු ගෙන්වන්නෙමි 10. තෙපි සහෝදරයන් ලවා වඳුරන් ගමට යවව් 11. අපි ඒ ගොවියන් දස දෙන ලවා කුඹුරු සතරක් සීසාවන්නෙමු 12. මව පුතා පුටුවෙහි හිඳුවා බත පිසවන්නට සහල් ගෙන්විය.

### පාලියට නැඟියයුතු කොටස

1. පාපකාරී තස්ස භාතරෙහි පක්ඛීනො මාරාපෙති 2. ධනවන්තා තෙසං පුත්තෙහි දානං දාපෙන්ති 3. රාජා වඩ්ඪකිහි මහන්තානි පඤ්ච ගෙහානි කරාපෙති 4. සාරථී දාසෙහි දෙව අස්සෙ රථස්ස සන්තිකං ආහරාපෙසි 5. තා ඉත්ථියො තාසං ධීතරෙහි අතිථීනං භත්තං පචාපෙසුං 6. වඩ්ඪකි කම්මකාරෙ බහූනි භණ්ඩානි කාරාපෙති 7. අධිපති මනුස්සෙහි වනෙ බහවො උච්චෙ තරවො පිඳාපෙති 8. තෙ වීසති ගොණෙව පඤ්ච මනුස්සෙ ච ඛෙත්තං කසාපෙස්සන්ති 9. අහං මම පුත්තෙ(ආහාරං) භොජෙමි 10. මයං අම්හාකං දාසෙ භණ්ඩානි ආනෙතුං නගරං පෙසෙස්සාම 11. තෙ ඛෙත්තං ගන්ත්වා ධෙනුයො තිණං ඛාදාපෙන්ති 12. අධිපති භික්ඛුහි විහාරෙසු ධම්මං දෙසාපෙති.

# 30 වෙනි අභ්‍යාසය

## සිංහලට නැඟියයුතු කොටස

1. ඊයේ වනයට ගිය පුරුෂයා සර්පයකු විසින් ඩසින ලද්දේ මළේය 2. ගසෙන් බැස්සා වූ පක්ෂීහු දරුවන් විසින් මරනලද්දහු වෙත් 3. ගමෙන් නික්මුණු දෙන්නු කෙතෙහි තණ කා වැවෙන් දිය බොන්නාහුය 4. වෙළෙන්දන් විසින් නුවරින් ගෙනෙන ලද බඩු මේ ගම්වල මිනිසුන් විසින් මිලට ගන්නාලදහ 5. ඒ කන්‍යාව විසින් පිසනලද බත වනයෙන් ආ ඇගේ සහෝදරයන් විසින් අනුභව කරන ලද්දේ වෙයි 6. මේ වස්ත්‍ර සහ ඒ නෙළුම්මල් නුඹලා විසින් කොතැනින් මිලදී ගන්නාලද්දහු ද? 7. ඒ තරුණිය මව ගෙන් ද පියාගෙන් ද ලැබුණු ධනය ගන්ට නොකැමතිවෙයි 8. කිපුණාවූ ඒ රජතෙම ඒ නුවර සියලු මිනිසුන් එයින් ඉවත්කරවීය 9. ගෙයින් ආවාවූ එක් දැරියක් මෙහි හුන් අනික් කුමරියකට ගැසීය 10. ඇය විසින් ගසනලද ඒ කන්‍යාතොමෝ ඇගේ මවළඟට ගොස් ඇඬුවේය 11. රජ තෙමේ වඩුවන් විසින් සාදනලද ගෙවල් බලා ඔවුන්ට වස්තුව දෙවි 12. ගින්නෙන් දැවුණු වෙළෙන්දාගේ පුතා දාසයන් විසින් වෙදෙකු වෙත ගෙනයන ලද්දේ වෙයි 13. ගින්නෙන් ද දියෙන් ද සොරුන්ගෙන් ද මිනිසුන්ට භය උපදී 14. නුවරින් නික්මුණු සොරු මිනිසුන් ලවා ධනය ගෙන්වා ගෙන වනයට ගියාහුය.

## පාලියට නැඟියයුතු කොටස

1. මයුරො රුක්ඛතො ඔතරිත්වා පබ්බතං අගමාසි 2. අහිනා දට්ඨො පුරිසො තස්ස ඤාතකෙහි වෙජ්ජස්ස සන්තිකං නීතො 3. අයං ඉත්ථී තස්සා භගිනිතො ලඬ්ඩං ධනං ගණ්හිතුං න ඉච්ඡති 4. ගාමතො ආගතො මනුස්සො අස්මා ආපණතො භණ්ඩානි කිණි 5. මාතුයා වුත්තං සුත්වා දාරකො මත මනුස්සස්ස සන්තිකං න ගච්ඡි 6. මම මාතුලානියා ධෙනුයො අටවිතො ආගන්ත්වා දාසීහි ආනීතානි තිණානි ඛාදන්ති 7. සුත්තං මනුස්සං දිට්ඨො ගහපති අත්තනො පුත්තා නංතස්ස සන්තිකං න ගන්තබ්බං ති කථෙසි 8. භත්තං පචන්තියා යුවතියා ධාවන්තො මිගො දිට්ඨො 9. තාය පක්කං භත්තං යාචකානං ධෙනූනං ච දින්නං හොති 10. තෙහි පබ්බතෙ

කතං ගෙහං හත්ථිනා භින්නං (හොති) 11. කුඬෙන රඤ්ඤා නගරං ආගතා සබ්බෙ මනුස්සා මාරිතා හොන්ති 12. හත්ථිනා භින්නා සාඛා භූමියං පති : පච්ඡා ධෙනූහි තස්ස පණ්ණානි ඛාදිතානි 13. තාය දාරිකාය, රාජදෙවියා ලඬා මාලා අඤ්ඤා දාරිකාය දින්නා 14. සෙට්ඨිනා කීතො අස්සො වොරෙන නීතො හොති

# දෙවෙනි පොත

## 1 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. ඔවුන් දෙදෙනාගේ ගෙවල බොහෝ භික්ෂූන්ට පනවනලද්දා වූ ම ආසනයෝ වෙත්. 2. ''මට පුත්‍රයෝ ඇත. මට ධනය තිබේ'' යයි අඥානයා වෙහෙසෙයි 3. ඉහත විසාලානුවරුන්ට මහත් රෝග උවදුරක් විය. 4. අපි සියලු දෙනම ධර්මය අසා එය මනාකොට මෙනෙහි කරන්නෙමු 5. අපගේ ශරීරය ආශ්‍රිතවූ මේ සියල්ලම විනාශ වෙයි 6. ''ස්වාමීනි, එය එසේ නොවේ'' යයි භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේට කීහ 7. දාසයා ගෙනා දර රැගෙන දාසිතොමෝ කැඳ පිසී 8. යම් දිනෙක මම නුවරට ගියෙම් ද, එදින පුරුෂයෙක් මගේ කුඩය ගත්තේය 9. දරුවෝ මල් නෙලන්ට වනයට ගොස් සුදුවූ ද නිල්වූ ද මල් ගෙනාවාහුය 10. ''එසේ නම් ඇවැත්නි, මාගේ පාත්‍රය හා සිවුර ගනිව්'' යයි තෙරුන් වහන්සේ කී සේක 11. තෙරුන්වහන්සේ නාසයෙහි තෙල් වත්කරනසේක් හුන්නේම වත්කොට ගමතුළට පිවිසියහ 12. අනේපිඬු සිටුතෙමේ ද විසාඛා මහා උපාසිකාව ද නිතර දවසකට දෙවරක් බුදුරදුන්ගේ උපස්ථානය පිණිස යත් 13. ඉගෙනගනු කැමති දරුවෝ උදෑසනම නැගිට කිසිවක් අනුභව කොට පාසැලට යත් 14. කුම්භඝෝසක තෙම කලින් ම නැගිට රජගහනුවර කම්කරුවන් පිබිදවිය 15. මහාමහිඳු ස්ථවිරයන් වහන්සේ අනික් පැවිද්දන් සතර දෙනෙකුන් සමග ලක්දිවට පැමිණ බුදුරදුන් විසින් කියනලද ධර්මය ලංකාවාසීන්ට දේශනා කළසේක.

### පාලියට නැඟියයුතු කොටස

1. මයි ගාමං ගතෙ මමෙකො මිත්තො මං එකං පොත්ථකං අදාසි 2. සම්බෙව සත්තා අත්තානං දෙහානි පහාය පරලොකං ගච්ඡන්ති 3. කුමාරියො නීලානි රත්තානි ච පුප්ඵානි ඔචිනිත්වා ආහරිත්වා මාතුයාපි පිතුනොපි අදංසු 4. පිතරා' හටානි දස ඵලානි මාතරා පුත්තානම්පි ධීතරානම්පි භාජිතානි හොත්ති 5. තථාගතස්ස නිසී දිතුං ජෙතවන විහාරෙ බහූනි ආසනානි පඤ්ඤත්තානෙව

අහෙසුං 6. පුරා ලාංකිකානං මහන්තො අමනුස්සුපද්දවෝ රොගුපද්දවො ච අහොසි 7. නො හෙතං ආවුසො'' ති සාරිපුත්ත ථෙරො භික්ඛුනං ආහ 8. ''මයං සෙව සාවත්ථිං ගමිස්සාමා'' ති ථෙරො ගාමවාසීනං ආහ 9. භික්ඛු පාතොවුට්ඨාය මාලක සම්මජ්ජනාදීනි කරොති 10. වට්ටගාමණී අභය රඤ්ඤෙ කාලෙ පිනෙරිතං ධම්මං පොත්ථකෙසු ලිඛිතං 11. ආබාධිකො' හං වීසති දිවසෙ වෙජ්ජස්මා හෙසජ්ජං අනුභවිත්වා අරොගො අහොසිං 12. සත්ථා විහාරං පත්තානං සබ්බෙ සම්පි ධම්මං දෙසෙසි 13. අනාථ පිණ්ඩිකො'පි සෙට්ඨී, විසාඛා'පි උපාසිකා සාවත්ථියං වෙ විහාරෙ කාරෙත්වා ස ථූනො අදංසු 14. සො' පිතානි වෙ කුලානි තිස්සාය ජබ්බීසති වස්සානි සාවත්ථියං වසී 15. මිගාරසෙට්ඨී' පි අත්තනො සුණිසං විසාඛං මාතුට්ඨානෙඨපෙති තස්මා සා මිගාරමාතා' ති පඤ්ඤයි

## 2 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. ඉදින් මේ කුමාර තෙමේ(ගිහි)ගෙයි වාසය කරයි නම් සක්විති රජ වන්නේය. 2. යහළුව දැන් මම විහාරයට ගොස් තෙරුන් වහන්සේ නුඹ විසින් සාදවන ලද පන්සලෙහි හුන්නහු දැක ආවේ වෙමි. 3. ඒ මම ඉදුරෑ හුල් ඇත්තේ වෙමි, සිහිල් වූයේද නිවියේද වෙමි. 4. ස්වාමීනි, ඔබ කවරෙක් වෙහිද? තෙරුන් වහන්සේගේ බෑනා වෙමි. 5. මුල උපද්‍රව නැතිව ස්ථිරව පවත්නා කල්හි යම් සේ කපන ලද්දාවූද ගස නැවතත් වැඩේද, එසේම මුල් බැස ගත් තෘෂ්ණාව නොඉදුරෑ කල්හි මේ දුක නැවත නැවත උපදී 6. මෙහි කවර නම් සම්පතක් පුරුෂයාට ශ්‍රේෂ්ඨද? මනා සේ පුරුදු කළ විට කුමක් සැප ගෙන දේද? මෙහි පුරුෂයාට ශ්‍රද්ධාව ශ්‍රේෂ්ඨ සම්පතයි. මනා සේ පුරුදු කළ ධර්මය සැප ගෙන දේ 7. මහණෙනි, එහෙයින් මෙහිදී මෙසේ හික්මිය යුතුය ''නුවණ දියුණු කිරීමෙන් වැඩෙන්නෙමු'' යි 8. මහණෙනි, ලෝකයෙහි මේ රෝගීහු තිදෙනෙක් ඇත්තාහ. රෝගීන්ට සමාන වූ පුද්ගලයෝ තිදෙනෙක්ද ඇත්තාහ. 9. බිජු

රකින්නා වූ කිරල් දෙනක් මෙන්ද වලිගය රකින්නා වූ සෙමෙරකු මෙන්ද තෙපිත් තමාගේ ශීලය මනා කොට රකිව් 10. ඒ හේතු වෙන්, අත් නොහැර යන සෙවණැල්ලක් මෙන් සැපය ඔහු අනුව එයි 11. ඔහුගේ ශරීරය යම් පමණද බඹයත් එපමණ වේ 12. මනා සේ යෙදූ නැටීමක් හෝ ගී කීමක් හෝ තූර්යවාදනයක් හෝ මෙහි නැත.

### පාලියට නැඟිය යුතු කොටස

1. යානීධ භූතානි සමාගතානි තෙ සබ්බෙ'ව සුමනා භවන්තු 2. තීනි'මානි භික්ඛවේ අකුසලමූලානි 3. යථෙව ඡින්නො රුක්ඛො භූමියං පතති, තථෙව මාරෙන මනුස්සා මරණං පාතීයන්ති 4. සොහං('සව' හං)තව වචනං න කරොමි. යථා මම මාතරා වුත්තං තථා කරොමි 5. සචා' යං කුමාරො පබ්බජිස්සති බුද්ධත්තං ලභිස්සති 6. ඉදනා' හං දාරකෙහි සද්ධිං විහාරං ගන්ත්වා ධම්මං සුත්වා ආගමිං 7. මාණවක, අපත්ථියං පත්ථයන්තො ත්වං බාලො'සි 8. ඉමස්ස ගාමස්ස ආසන්නෙ කොචි ආරඤ්ඤකො විහාරො අත්ථී'ති පුට්ඨෙ, උපාසකො ''භන්තෙ අත්ථී'' ති ආහ 9. අමච්චො ''සාධු දෙවා'' ති වත්වා රාජගෙහා නික්ඛමි 10. ආනන්දසෙට්ඨී අත්වඬමාසං අත්තනො ඤාතකෙ සන්නිපාතා පෙත්වා තෙසං පුරතො පුත්තං ඔවදි 11. යථා හි මනුස්සො එකචක්ඛුකො තං චක්ඛුං රක්ඛති එවං සීලං සම්මා රක්ඛිතබ්බං 12. දෙවතායෙන භගවා තෙනුපසංකමිත්වා තං අභිවාදෙත්වා එකං පඤ්හං පුච්ඡි

## 3 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. මිනිස්සු ආයුෂ ගෙවීමෙන්ද, කර්මය ගෙවීමෙන්ද, පින් ගෙවීමෙන්ද මැරෙත් 2. සුමේධ තාපස තෙම ප්‍රථම ධ්‍යානයද ද්විතීය ධ්‍යානයද ඉපදවීය 3. නිර්මල ශීලය රැකීම මහත් ඵල ඇත්තේද මහත් අනුසස් ඇත්තේද වේ. 4. ප්‍රේමයෙන් ශෝකය හට ගනී, ප්‍රේමයෙන් බිය හට ගනී, ප්‍රේමයෙන් මිදුනු තැනැත්තා හට ශෝකයක් නැත, බියක් කොයින්ද? 5. භාග්‍යවතුන් වහන්සේ විසින් තෘෂ්ණාව

නැති කිරීම පිණිස ධර්මය දෙසන ලද්දේ වෙයි 6. විශාඛාවෙනි, කිලිටි වූ ශරීරයාගේ පිරිසිදු කිරීම උපක්‍රමය කරණ කොට වේ 7. යමෙක් තරාදිය මෙන් ඔසවා (විමසා) ගෙන උතුම් දෙය රැගෙන පව් දුරු කෙරේ නම් හෙතෙම මුනි නම් වේ 8. මෙහි වෛරයෙන් වෛරයෝ කිසි කලෙකත් නොසන්සිඳෙත්, වෛර නොකිරීමෙන්ම (වෛරයෝ) සන් සිඳෙත්. මෙය පුරාතන ධර්මයකි 9. ධර්මාශෝක රජ තෙමේ දේවානම්පියතිස්ස රජුට බොහෝ පඬුරු එවා නැවතත් රාජ්‍යාභිෂේකය කරවී 10. යමෙකු තුළ ධ්‍යානයත් නුවණත් ඇත්ද හෙතෙම ඒකාන්තයෙන් නිවණ සමීපයෙහිය 11. සියලු සංස්කාරයෝ නිත්‍ය නොවෙත් යයි යම් කලෙක නුවණින් දකීද, එකල දුකෙහි කලකිරේ. මෙය නිවන ලැබීමට මගයි.

### පාලියට නැගිය යුතු කොටස

1. දෙවා පුඤ්ඤක්ඛයෙන ආයුක්ඛයෙන ච දෙවලොකාචවන්ති 2. තාපසා පඨමජ්ඣානං ලභිත්වා චිත්තානි නිම්මලානි කරොන්ති 3. නිද්ධනෙහි දානං න සුකරං 4. යො අප්පස්සුතො සො නිබ්බාණං න ලභති 5. එණපිණ්ඩුපමො රූපක්ඛන්ධො' ති භගවා ආහ 6. භගවති වෙසාලිං ගච්ඡන්තෙ බිම්බිසාර රාජා තස්ස ච භක්ඛුසංඝස්ස ච සෙතච්ඡත්තානි ධාරාපෙසි 7. තිම්මලං සීලං පාලෙත්වා දේවලොකෙ නිබ්බත්තිත්වා දිබ්බසම්පත්තිං අනුභවිස්සන්ති 8. සප්පුරිසෙහි පුඤ්ඤස්ස කරණං සුකරං 9. රාජානො අත්තානං රත්ථෙසු දුබ්බහික්ඛභයං වාරෙතුං න සක්කොන්ති 10. මනුස්සා මහප්ඵලං ලභිතුං දානාදිනී පුඤ්ඤානි කරොන්ති.

## 4 වෙනි අභ්‍යාසය

### සිංහලට නැගියයුතු කොටස

1. ''තමාගේත් ඒ දේවතාවන්ගේත් ශ්‍රද්ධාවද ශීලයද ශ්‍රැතය ද ත්‍යාගයද ප්‍රඥාවද සිහි කරන්නා වූ ඔහුගේ සිත පැහැදේ'' 2. වෙළෙන්දෙක් යහපත් අශ්වයකු හික්මවන්නා සේ (එහෙයින්) තමා හික්මවයි 3. ඔබගේ ඒ වචනය කරමි ඔබ මාගේ ගුරුවරයා වහි 4.

බුදුරදුන් සිහි කරව්. තොපට භයක් නොවන්නේය. 5. මම මෙසේ සිතා නොයෙක් කෝටි සිය ගණන් ධනය පිහිට ඇති නැතියන්ට දී හිමාලය වනයට එළඹියෙමි 6. දානපති දායක තෙමේ යම් යම් පිරිසකට එළඹේ නම් නිර්භය වූයේම එළඹෙයි 7. මෙසේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන්ගේ ධර්මය දැන ගෙනම මම ඒ ධර්මයෙන් හා විනයෙන් ඉවත් වූයෙමි 8. එසේ නම් ගෘහපතිය, මෙහිදී ඒ කරුණම ඔබගෙන් විචාරන්නෙමි 9. එයම ඔහුට තමා සතු දෙය වේ එයම රැ ගෙන යයි 10. මහණෙනි, මොහු සතර ආර්ය සත්‍ය යෝගයයි යමක් කියන ලදද එය මේ සඳහා කියන ලදී 11. තණ්හන්කරය, මේධංකරය, සරණංකරය, දීපංකරය යි බුදුවරු සතර නමක් එකම කල්පයෙහි උපන්නාහ 12. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළාහ. සතුටු සිතැති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු වූහ 13. උඩුකුරු පා ඇත්තේ යටිකුරු හිස් ඇත්තේ ඒකාන්තයෙන් නිරයට වැටෙමි.

## පාලියට නැඟියයුතු කොටස

1. සීලවා යඤ්ඤං පරිසං උපසංකමති, විසාරදෙව උපසංකමති, ඉදම්පි සීලස්සෙකං ඵලං 2. අහ මෙවං චිත්තයිත්වා යාචකානං ද්විසතස්ස දානං අදාසිං 3. තඤ්ඤෙවා'හං කාරනං තං පටිපුච්ඡිං 4. දෙසනාවසානෙ භික්ඛු සාරිපුත්තත්‍රෙරස්ස භාසිතං අභිනන්දිංසු 5. තුම්හෙ වෙ නිබඬං බුද්ධං සරථ භයං තුම්හාක නො සියා 6. යඤ්ඤදෙව පුඤ්ඤං වා පාපං වා මනුස්සො කරොති, තඤ්ඤෙව තමනු ගච්ඡති 7. අජ්ජෙව මයං බුද්ධඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණං ගච්ඡාම 8. ගොණස්ස පදමනුගච්ඡන්තං චක්කං'ව දුක්ඛං පාපකාරී මනුගච්ඡති 9. අත්තනො චිත්තං සම්බෙහි පාපෙහි සොධෙ තබ්බන්ති එතං බුද්ධානසාසනං 10. භගවා ඉදං වත්වා උත්තරිම්පි තෙසං ධම්මං දෙසෙසි 11. යං මයා වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං 12. මනුස්සො උඬපාදෙ අවංසිරො රුක්ඛම්හා පති.

## 5 වෙනි අභ්‍යාසය

### සිංහලට නැඟියයුතු කොටස

1. රජතෙම නුවර හැසිරෙන්නේ ධර්මය දෙසන එක් තාපසයකු දුටුවේය 2. ධර්මය අසන්නා වූ බොහෝ මිනිස්සු රජු එන කල්හි ඔහු(දෙස) ම බැලූහ 3. රජුන් තම තමන්ගේ රට වල හැසිරෙන කල්හි බොහෝ සේවකයෝ සුදු කුඩ ගෙන ඔවුන් අනුව යත් 4. රජුහු තමන්ගේ කුමරුන් තම තමන්ට අයිති රාජ්‍යයන්හි පිහිටුවනු කැමැත්තාහු ඔවුන්ට නොයෙක් ශිල්ප උගන්වත් 5. දුටුගැමුණු රජුට සාලි කුමාර නම් එකම පුතෙක් විය. හෙතෙම තමාගේ පියාට අයිති රාජ්‍යය ලබන්ට නොකැමති විය 6. ඒ රජතෙම එළාර නම් දෙමළ රජු මරා බුදුසසුනට සංග්‍රහ කරමින් මහත් වූ චෛත්‍යයන් ද බොහෝ විහාරයන් ද කරවීය 7. මෙසේ අතිශයින් වැන්ද යුතු වූ රත්නත්‍රය වඳින්නා වූ මම යම් මහත් වූ පින් රැසක් ලැබුවෙම්ද ඒ පුණ්‍යරාශියේ බලයෙන් නැසූ අනතුරු ඇත්තේය 8. ඉක්බිති විමසා බලන ඔහුට මේ සිත උපණිඃ දුර පිහිටි ජනපදයන්හි වනාහි ශාසනය මනාව පිහිටියේ වන්නේ ය යි'' 9. සිටුතෙම වෙවේලන්නේ ධන ශෝකයෙන් සිහිය එළවා ගන්ට නොහැකිව එහිම වැටුණේය 10. ඇතැම් පුද්ගලයෙක් පහත් කුලයෙහි උපන්නේ වෙයි ..... හෙතෙමේද බොහෝ රෝග ඇත්තෙක් හෝ එකැස් කණෙක් හෝ කොර වූ අත් ඇත්තෙක් හෝ වෙයි.

### පාලියට නැඟිය යුතු කොටස

1. දුට්ඨගාමිණී - මහාරාජෙන අනුරාධපුරෙ රත්නමාලී චෙතියං කාරාපිතං 2. පඤ්චමො ජෝර්ජ්මහාරාජා අත්තනො පුත්තං එඩ්වඩ් කුමාරං ලංකාදීපං පෙසෙසි 3. දෙවානම්පියතිස්ස රාජිනී ලංකාය රජ්ජං කරොන්තෙ අසොකාධිරඤ්ඤෙ පුත්තො මහින්දත්ථෙරවරො ලංකාදීපං ආගම්ම බුද්ධසාසනං පතිට්ඨාපෙසි 4. රාජූනං ආණාය කාරිතා බහු විහාරා චෙතියානි ච ඉධ සන්ති 5. බුඬ්ඩො කපිලවත්ථු සමීං අත්තනො ඤාතකෙහි කාරිතෙ විහාරෙ කතිපයෙව මාසෙ වසි 6. ධම්මා සොකරාජා අනාගතෙ බුඬසාසනං

පච්චන්තිමෙසු දෙසෙසු සම්මා පතිට්ඨස්සතීති අඤ්ඤසි 7. අත්තනො සාමනො'ධිරාජස්ස කිරීටධාරණ මොලොකෙතුං බහවො රාජානො සන්නිපතන්ති 8. සබ්බෙ රාජානො අත්ත නමච්චයෙන සකෙ පුත්තෙ සක සකෙසු සීහාසනෙසු ඨපෙතුං ඉච්ඡන්ති 9. රාජිනී අත්තනො රට්ඨෙ ගාමෙ ච නගරෙ ච උපපරික්ඛන්තෙ බහූ සෙවකාතමනුගච්ඡන්ති 10. ධම්මං සුණන්තා මනුස්සා රාජිනී සම්පත්තෙ ගාරවං දස්සෙතු මුට්ඨහිංසු.

## 6 වෙනි අභ්‍යාසය

### සිංහලට නැගියයුතු කොටස

1. වෙළඳුන් දෙදෙනෙකුන් විසින් යාච්ඥා කරන ලද භාග්‍යවතුන් වහන්සේ තමන්ගේ හිසින් මිටක් පමණ හිසකෙස් ඔවුන්ට දුන් සේක 2. ඔවුහු භාග්‍යවතුන් වහන්සේට හිස බිම තබා වැඳ ඒවා තමන්ගේ නුවරට ගෙන ගොස් පියුම් ආදියෙන් පිදූහ 3. බෝධි සත්වයන් වහන්සේ වයසින් විසි නව අවුරුදු ඇත්තේ ගිහි ගෙයින් නික්මී සේක . නැවත වයසින් පන් තිස් අවුරුදු ඇත්තේ බිම්බිසාර රජු වෙත පැමිණි සේක 4. අඳුරු දුරු කරන භාග්‍යවතුන් වහන්සේ මනෝමය ශරීරයෙන් කමටහන් මෙනෙහි කරන භික්ෂූන් ඉදිරියෙහි පහළවන සේක 5. සෘධි ඇති තාපස තෙමේ සාගරයද වියළවන්ට සමර්ථ වෙයි 6. මහානරකය වනාහි යකඩ ප්‍රාකාරයකින් වට කරන ලද්දේය. යකඩ පියනකින් වසන ලද්දේය, ඒ නිරයගේ යකඩින් කළ බිම ගින්නෙන් දැල්වුනේ වෙයි 7. ගැල් පදවන්නෝ ගවයන්ට තණකොළ දී ඔවුන් ගැල්වල යොදා ගැල් පදවමින් බරණැසට ගියහ 8. (කුශලාකුශල) ධර්මයෝ සිත පෙරටු කොට ඇත්තාහ. සිත ප්‍රධාන කොට ඇත්තාහ, සිතින් උපන්නාහුය 9. මිනිස්සු දෙනගෙන් කිරිද කිරෙන් දීද දියෙන් ගිතෙල්ද ලබත් 10. හෙතෙම මෛත්‍රියෙන් යුක්ත සිතින් එක් දිශාවක් පතුරුවා වසයි, එසේ දෙවෙනි දිශාවද තෙවෙනි දිශාවද(පතුරුවා වසයි) 11. භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සිත පැහැදවීමෙන් බොහෝ දෙන මහත් වූ දිව්‍ය සම්පත් ලැබූහ 12. භාග්‍යවතුන් වහන්සේ අහසින්

ලක්දිවට වැඩ යකුන්ගේ රැස්වීම මත්තෙහි අහසෙහි වැඩ හිඳ දහම් දෙසීමෙන් ඔවුන් හික්මවූ සේක 13. යකඩින් හට ගත් මලකඩ එයින් හටගෙන එයම කන්නා සේ. 14. වචනයෙන් කරන ලද කර්මය වාචසික නම්, සිතින් කරන ලද කර්මය මානසික නම්.

## පාලියට නැගිය යුතු කොටස

